කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT
2025

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
இறக்குமதி மற்றும் ஏற்றுமதிக் கட்டுப்பாட்டுத் திணைக்களம்
DEPARTMENT OF IMPORTS AND EXPORTS CONTROL

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

කාර්යසාධන වාර්තාව - 2025

වැය ශීර්ෂය - 296

ආනයන හා අපනයන පාලන

දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාලක ජනරාල්ගේ පණිවුඩය

ආනයනය හා අපනයන පාලන දෙපාර්තමේන්තුව 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත මඟින් ස්ථාපිත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවකි. 2025 වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුවේ ඉලක්ක සාක්ෂාත් කරගනිමින් ලබා ගත් ජයග්‍රහණයන් ද ඇතුළත්ව කාර්යසාධන වාර්තාව නිකුත් කරන මෙම අවස්ථාවේ ඒ සඳහා දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වශයෙන් පණිවුඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

ආනයන හා අපනයන (පාලන) පනතට අනුකූලව මෙරට ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන තිරසර සංවර්ධිත රටක් උදෙසා ආනයන හා අපනයන ක්‍රමවේදය නියාමනය යන "මෙහෙවර" ඔස්සේ දෙපාර්තමේන්තුව මෙහෙයවීමට 2025 වර්ෂයේ දී නව ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී. විශේෂයෙන් වසර ගණනාවක් අත්හිටුවා තිබූ වාහන ආනයනය ආර්ථිකයට බරක් නොවන සේ කලමණාකරණය හා නියාමනය කරමින් විධිමත් ලෙස විවෘත කිරීමට අවශ්‍ය නෛතික පදනම 2025 ආරම්භයේ දී ම ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රකාශිත අති විශේෂ ගැසට් පත්‍රයක් හරහා සිදු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ක්‍රියාත්මක කිරීමෙහිලා අතිවිශේෂ ගැසට්පත්‍ර 10 ක් අවස්ථාවෝචිතව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ අනුමැතිය මත නිකුත් කිරීමට කටයුතු කරන ලදී. වර්ෂ 2025 කාලය තුළ රට මුහුණ දුන් ආර්ථික, සමාජීය හා ජාත්‍යන්තර වෙළඳ පරිසරයේ ඇති වූ විවිධ අභියෝග මධ්‍යයේ දී, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සිය වගකීම් කාර්යක්ෂමව හා වගකීමෙන් ඉටු කිරීමට කැපවීමෙන් ක්‍රියාත්මක විය.

එසේම, ආනයන හා අපනයන නියාමනය සඳහා රාජ්‍ය ආයතන අතර සහයෝගීතාවය වැඩිදියුණු කිරීම අප දෙපාර්තමේන්තුවේ තවත් ප්‍රමුඛ අවධානයක් යොමු විය . අදාළ අමාත්‍යාංශ, නියාමන ආයතන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින්, ජාතික වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සහ ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමේදී අර්ථවත් දායකත්වයක් ලබාදීමට හැකි විය. මෙය ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සහ උපායමාර්ගික වෙළඳ පාලන අවශ්‍යතා සමඟ සම්බන්ධව රටේ විශ්වාසනීයභාවය තහවුරු කිරීමටද උපකාරී විය.

තවද, මෙම කාලය තුළ, විනිවිදභාවය, කාර්යක්ෂමතාවය සහ සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් විවිධ සංවර්ධන ක්‍රියාමාර්ග හඳුන්වා දීමට අප දෙපාර්තමේන්තුවට හැකි විය. එම ප්‍රතිසංස්කරණ අතරින් විශේෂ වැදගත්කමක් හිමි වූයේ Stratlink ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම හා ශක්තිමත් කිරීමයි. නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ආනයන හා අපනයන සේවා සැපයුම් ක්‍රියාවලීන් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කිරීම තුළින්, පෙර පැවති කඩදාසි මත පදනම් වූ (paper-based) ක්‍රමවේදයෙන් ඉවත් වී ලේඛන රහිත (paperless) සේවා පද්ධතියක් වෙත පියවර තැබීමට හැකි විය. ඉලෙක්ට්‍රොනික බලපත්‍ර පද්ධතිය හරහා

සේවාලාභින්ට දෙපාර්තමේන්තුවට භෞතිකව පැමිණීම අවශ්‍ය නොවන අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීම, ලේඛන උඩුගත කිරීම, අයදුම්පත් තත්ත්වය පරීක්ෂා කිරීම සහ අදාළ අනුමැති ලබාගැනීම වැනි සියලුම ක්‍රියාවලීන් මාර්ගගත පද්ධතිය මඟින් සිදු කරගැනීමට අවස්ථාව ලැබී ඇත. එමඟින් සේවාලාභීන්ගේ කාලය, වියදම සහ ශ්‍රමය ඉතිරි කරගැනීමට හැකි වූ අතර, සේවා ලබාගැනීමේ පහසුව සහ ප්‍රවේශයද සුවිශේෂී ලෙස වැඩිදියුණු විය.

තවද, ඉලෙක්ට්‍රොනික බලපත්‍ර පද්ධතිය හරහා අදාළ රාජ්‍ය ආයතන අතර දත්ත හුවමාරු සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම තුළින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම සහ විශ්වාසනීය බවට පත් විය. මෙවැනි ඩිජිටල් ප්‍රතිසංස්කරණ හරහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මහජන සේවාව කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුක්ත සේවාවක් ලෙස උසස් මට්ටමකට ගෙන ඒමට සමත් වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මානව සම්පත් සංවර්ධනය සහ කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම ද අපගේ අවධානය යොමු වූ තවත් වැදගත් ක්ෂේත්‍රයකි. පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩමුළු සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම් හරහා නිලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. එමඟින් සේවා සැපයුම් ගුණාත්මකභාවය ඉහළ නංවා ගැනීමටත්, නව අභියෝග හමුවේ වඩා වගකීමෙන් හා වගවීමෙන් ක්‍රියාත්මක වීමටත් හැකි විය.

මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කර ඇති ප්‍රගතිය, අභියෝග සහ අත්දැකීම්, ඉදිරි වසර සඳහා වඩා ශක්තිමත්, සහ පුරෝගාමී දෙපාර්තමේන්තුවක් ලෙස ඉදිරියට ගමන් කිරීම සඳහා මාර්ගෝපදේශයක් වනු ඇතැයි මම විශ්වාස කරමි. ඉදිරියටද ජාතික අවශ්‍යතා, මහජන විශ්වාසය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් සැලකිල්ලට ගනිමින් අපගේ කාර්යභාරය වගකීමෙන් ඉටු කිරීමට අපි කැපවී සිටිමු.

තව ද, මෙම කාල පරිච්ඡේදය තුළ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලද මාර්ගෝපදේශකත්වය ද සැළකිය යුතු වේ. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය හා සෘජුවම බැඳුණු , ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව හා වාණිජ බැංකු පද්ධතිය, බලපත්‍ර නිකුත් කිරීමේ දී නිර්දේශ සපයනු ලබන අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පෞද්ගලික අංශයේ අනෙකුත් සියලුම පාර්ශවකරුවන් ද ස්තුති පූර්වකව මෙහි සඳහන් කරමි. මෙම කාලය තුළ අප දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් විසින් දැක්වූ කැපවීම, ශක්තිය සහ වෘත්තීමයභාවය සඳහා මාගේ කෘතඥතාවය පළ කරමි. ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම හා සහයෝගය තුළ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට සිය මෙහෙවර සාර්ථකව ඉටු කිරීමට හැකි වී ඇත.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත මඟින් ආවරණය වන නෛතික රාමුව තුළ රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා අනුගත වෙමින් පෞද්ගලික අංශය බහුතරයක් වන සේවාලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුවන පරිදි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙහෙයවමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමට ඉදිරියටත් ඇප කැප වන්නට දෙපාර්තමේන්තුවේ අපි සියල්ලන්ම එක්ව තිරසාර අදිටනින් යුතුව මතුවටත් ක්‍රියාකරනු ඇත.

ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්

පටුන

1	**පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	**1**
1.1	හැඳින්වීම	**1**
1.2	දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	**2**
1.3	දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය	**3**
1.4	සංවිධාන ව්‍යුහය හා සටහන	**4**
2	**පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	**7**
2.1	භාණ්ඩ ආනයන හා අපනයනය නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග	**7**
2.2	ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම	**15**
2.3	පසුගිය වසර 3 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය	**23**
2.4	ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග	**30**
2.5	ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන හා පහසුකරණය	**31**
2.6	නව වැඩිදියුණු කිරීම්	**34**
3	**පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**	**36**
3.1	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	**36**
3.2	2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	**37**
3.3	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	**38**
3.4	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	**39**
3.5	2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	**40**
3.6	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	**40**
3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	**40**
3.8	විගණකාධිපතිගේ වාර්තාව	**41**
4	**පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය**	**41**
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	**41**
5	**පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය**	**42**
5.1	හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු	**42**
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	**47**
6	**පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**	**48**
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	**48**
6.2	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම	**48**
6.3	මානව සම්පත් සංවර්ධනය	**49**
7	**පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**	**56**
සමාප්ති සටහන		**64**
ඇමුණුම (1) විගණකාධිපති වාර්තාව		

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත පාදක කර ගනිමින් ස්ථාපිත වූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආරම්භක අවධියේ පැවති සාම්ප්‍රදායික නියාමන කාර්යභාරයෙන් ඔබ්බට යමින්, ජාත්‍යන්තර වෙළෙඳාමට සරිලන සහ වෙළෙඳ පහසුකම් වර්ධනයට දායක වන ආයතනයක් ලෙස වර්තමානය වන විට විකාශනය වී ඇත.

ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ අදහස්, යෝජනා, නිරීක්ෂණ හා උපදෙස් සැලකිල්ලට ගෙන එම ආයතන සමඟ සමීපව කටයුතු කරමින්, අවස්ථානුකූලව උපායමාර්ගික ප්‍රවේශයක් ඔස්සේ එකී පනතෙන් හිමි බලතල ප්‍රකාරව ආනයන හා අපනයන වෙළෙඳාම හා බැඳුණු ගෙවීම් ක්‍රම නියාමනය කිරීම තුළින් මෙම දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත.

ආර්ථිකය මත පැවති පීඩනය පහව යාමේ ධනාත්මක ප්‍රවණතාවය පිළිබඳ අවධානය යොමු කරමින්, පනවා තිබූ සියලුම තාවකාලික ආනයන සීමා කිරීම් 2025 වර්ෂයේ මුල් කාර්තුව තුළ ඉවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබීය.

ජාතික ආරක්ෂාව, පරිසර සංරක්ෂණය, මහජන සෞඛ්‍ය සහ ආර්ථික සුරක්ෂිතතාව සුරක්ෂිත කිරීමේ අරමුණින්, ආනයන හා අපනයන අයිතමයන් ප්‍රමාණාත්මක ගුණාත්මක පාලනය උදෙසා ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් හැකි සෑම පියවරක්ම ගෙන ඇත. එහිදී, බාසල්, මොන්ට්‍රියල් ඇතුළු පරිසරය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගත වෙමින් අදාළ ආනයන ක්‍රමවේදය ක්‍රියාත්මක කරමින් පවතී.

තවද, ආනයන භාණ්ඩවල ප්‍රමිතිය නිර්ණය කිරීම මඟින් මහජන සෞඛ්‍ය ආරක්ෂාවට අදාළ විධිවිධාන පනවා ඇති අතර, ආනයනික භාණ්ඩ 164ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති අනිවාර්ය කර ඇති අතර, එය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. ඊට අමතරව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා අංක 1540 ක්‍රියාත්මක කිරීම සඳහා නව නීතිරීති සම්පාදනය කිරීමේ කටයුතු ද ආරම්භ කර ඇත.

වසර ගණනාවකට පසු ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්ති රාමුව යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇති අතර, බොහෝ ප්‍රතිපත්ති වර්තමාන අවශ්‍යතා සහ සේවාලාභීන්ගේ පහසුව සැලකිල්ලට ගනිමින්, නෛතික රාමුව තුළ ආනයන ක්‍රියාවලිය කඩිනම්ව සිදු කරගැනීමට හැකිවන පරිදි සංශෝධනය කර ඇත.

දෙපාර්තමේන්තුව ස්වකීය දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙන යමින්, තිරසර සංවර්ධනය සහ ගෝලීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව, සේවාලාභීන් වෙත කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් සපයනු වස් STRATLINK ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය ස්ථාපිත කර 2025.01.01 දින සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මකව පවතී.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 ආයතනික දැක්ම

තිරසර සංවර්ධිත රටක් උදෙසා
ආනයනය හා අපනයනය නියාමනය

1.2.2 ආයතනික මෙහෙවර

රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන, භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත අනුව ක්‍රියාත්මක කිරීම.

1.2.3 අරමුණු

රටේ ආරක්ෂාව තහවුරු කිරීම, ආර්ථිකය නංවාලීම සහ මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව ආනයන හා අපනයන නියාමනය කිරීම.

1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය

i. ආනයන හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් අතිවිශේෂ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.

ii. ආනයන හා අපනයන පාලනයට අදාළවන මෙහෙයුම් මාර්ගෝපදේශ, වාණිජ බැංකුවලට, ශ්‍රී ලංකා රේගුවට හා අනෙකුත් ආයතන වෙත නිකුත් කිරීම.

iii. ආනයන හා අපනයන (පාලනය) සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන රෙගුලාසිවලට අදාළවන පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

iv. ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය කිරීම.

v. බලපත්‍ර පාලනයට යටත් කළ අයිතම ආනයනයෙන් පසු හරපත්‍ර නිකුත් කිරීම.

vi. ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි හෝ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරනු ලබන ආනයනකරුවන් සඳහා අතිරේක ගාස්තු පැනවීම.

vii. උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ ක්‍රමයක් සහ ප්‍රමිතිකරණය වූ ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

viii. දේශීය සහ විදේශීය වෙළෙඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.

ix. බාසල් සම්මුතිය, මොන්ට්‍රියල් සම්මුතිය ආදී ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගත වීම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම.

x. ජාත්‍යන්තර වාණිජමය ගනුදෙනුවලට අදාළ වන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම හා නියාමනය කිරීම.

xi. ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය සහාය / උපදෙස් ලබාදීම.

xii. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාව, නිපුණත්වය හා ඵලදායිතාවය වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සේවක සුබසාධනය.

xiii. අදාළ රජයේ ගාස්තු එක්රැස් කර, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

1.4 සංවිධාන ව්‍යුහය හා සටහන

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානියා වශයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් කටයුතු කරනු ලබයි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත ප්‍රකාරව ක්‍රියාත්මක කරන නීතිරීති, රෙගුලාසි පැනවීම් හා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම් ඇතුළු ආනයන හා අපනයන ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ හා ඒකකවලින් සමන්විතව ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ආයතන අංශය
II. ගිණුම් අංශය
III. පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශය
IV. අභ්‍යන්තර විගණන අංශය
V. බලපත්‍ර නිකුත් කිරීමේ අංශ
- ඒකක 1 - ඖෂධ හා වෛද්‍ය උපකරණ
- ඒකක 2 - භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්
- ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන
- ඒකක 4 - ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්
- ඒකක 5 - සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන

VI. තොරතුරු තාක්ෂණ අංශය
VII. නීති අංශය

දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත සඳහන් සංවිධාන ව්‍යුහය (Organization Chart) යටතේ සේවාලාභීන් වෙත නිරතුරුව සේවය කිරීමට කැපවීමෙන් ක්‍රියාකරනු ලබයි.

2025.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 122 ක් වන අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පුරප්පාඩු 18 ක් පැවතියද පවතින කාර්ය මණ්ඩලය මඟින් සේවාලාභීන් වෙත ප්‍රශස්ත සේවයක් ලබා දීමට 2025 වර්ෂයේදී කටයුතු කර ඇත.

කාර්යමණ්ඩල තොරතුරු ලේඛනය පහතින් දැක්වේ.

2025.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර	සේවය/ ශ්‍රේණිය				අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ							
ආනයන හා අපනයන පාලක ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	විධායක	01	01	00
ආනයන හා අපනයන පාලක	ශ්‍රී.ලං.ප.සේ	I	SL 1	විධායක	02	01	01
ආනයන හා අපනයන පාලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	දීප ව්‍යාප්ත සේවා	I	SL 1	විධායක	01	01	00
නියෝජ්‍ය/සහකාර පාලක	ශ්‍රී.ලං.ප.සේ	II/III	SL 1	විධායක	06	05	01
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1	විධායක	01	01	00
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1	විධායක	01	01	00
නීති නිලධාරි	දෙපාර්මේන්තුගත	II/III	SL 1	විධායක	01	01	00
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	ශ්‍රී.ලං.තො.තා.සේ	III	SL 1	විධායක	01	01	00
					14	**12**	**02**
තෘතියික							
පරිපාලන නිලධාරි	ක.සේ.නි.සේ.	අධි	MN 7	තෘතියික	01	01	00
භාෂා පරිවර්තක	භා.ප.සේ.	I/II	MN 6	තෘතියික	02	01	01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	ශ්‍රී.ලං.තො.තා.සේ	II	MN 6	තෘතියික	01	01	00
					04	**03**	**01**
ද්විතියික							
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.තා.සේ.	III	MT 1	ද්විතියික	03	03	00
දත්ත කළමනාකරණ සහකාර	දෙපාර්මේන්තුගත		MN 4	ද්විතියික	01	01	00
විමර්ශන සහකාර	දෙපාර්මේන්තුගත		MN 4	ද්විතියික	01	01	00
සංවර්ධන නිලධාරි	සං.නි.සේ	I/II/III	MN 4	ද්විතියික	23	20	03
කළමනාකරණ සේවා නිලධාරි	ක.සේ.නි.සේ.	I/II/III	MN 2	ද්විතියික	56	49	07
					84	**74**	**10**
ප්‍රාථමික							
රියැදුරු	රියදුරුසේ.	I/II/III	PL 3	ප්‍රාථමික	05	02	03
කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ.	I/II/III	PL 1	ප්‍රාථමික	15	13	02
					20	**15**	**05**
එකතුව					**122**	**104**	**18**

සංවිධාන සටහන



නි.පා.	- නියෝජ්‍ය පාලක	දත්ත.ක.ස.	- දත්ත කළමනාකරණ සහකාර
ස.පා.	- සහකාර පාලක	විමර්ෂණ.ස.	- විමර්ශණ සහකාර
සහකාර අධ්‍යක්ෂ.තො.ත.	- සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ)	ස.නි	- සංවර්ධන නිලධාරී
තො.ස.තා.නි	- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ක.සේ.නි.	- කළමනාකරණ සේවා නිලධාරී
තො.ස.තා.ස	- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	කා.කා.ස.	- කාර්යාල කාර්ය සහායක
ප්‍ර.ක.සේ.නි.	- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී		

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 භාණ්ඩ ආනයනය හා අපනයනය නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග

ශ්‍රී ලංකා මහ බැංකුවේ ද එකඟතාවය සහිතව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Codes) 304 ක් යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළව පනවා තිබූ තාවකාලික ආනයන අත්හිටුවීම යම් යම් සීමාවන්ට යටත්ව ඉවත් කිරීමට කටයුතු කිරීම 2025 වසර තුළ ආනයනයන් සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රධාන තීරණයන් ලෙස දැක්විය හැකිය.

එලෙස වාහන ආනයනය සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීමත් සමඟ විදේශ සංචිතවලට සිදුවන බලපෑම අධීක්ෂණය කිරීම සඳහා වාණිජ බැංකු විසින් විවෘත කරන ලද ණයවර ලිපිවල වටිනාකම සහ ප්‍රමාණයන් දිනපතා වාර්තා කරමින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට හා ශ්‍රී ලංකා මහ බැංකුවට සහාය දැක්වීම 2025 වර්ෂයේදී අඛණ්ඩව සිදු කරන ලදී.

එසේම,මහජනතාව වෙත ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා පාරිභෝගික භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ නීත්‍යානුකූල සහ විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීම 2025 වසර තුල සිදු කරන ලදී.

තවද, 2025 වර්ෂයේදී වරින් වර ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වයන් හමුවේ මෙන්ම දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වය හමුවේ අත්‍යාවශ්‍ය භාණ්ඩ වල අඛණ්ඩ සැපයුම සහතික කිරීමට මෙන්ම ආපදා සහන වශයෙන් විදේශයන්ගෙන් ලැබෙන භාණ්ඩ පරිත්‍යාග කඩිනමින් රේගු නිෂ්කාෂණය කිරීම සඳහා පහසුකම් සැලසීමට රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට ද කටයුතු කරන ලදී.

2.1.1 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නව රෙගුලාසි නිකුත් කිරීම

අනු අංකය	අතිවිශේෂ ගැසට් නිවේදන අංකය	දිනය	විස්තරය
1	2421/04	2025.01.27	වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.
2	2421/44	2025.01.31	පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම.
3	2428/07	2025.03.19	භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත්

			පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම සහ 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිකුත් කිරීමට බලපත්‍ර බැංකුවලට බලය පැවරීම.
4	2434/12	2025.04.29	2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම.
5	2435/02	2025.05.05	2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යුත් වාහන සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම්, මෝටර් වාහන ආනයනය සඳහා අදාල වන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සඳහා ඇතුලත් කිරීම.
6	2437/04	2025.05.19	සංයෝංජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 යටතේ වර්ගීකරණය කරන ලද අමු අයඩීනීකරණය නොකළ ලුණු සහ ආහාරයට ගත හැකි අයඩීනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව 2025 ජූනි 10 දක්වා ඉවත් කිරීම.
7	2449/60	2025.08.15	2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල වලංගු කාල සීමාව 2025 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීම.
8	2458/43	2025.10.15	සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද, කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව, 2025 ඔක්තෝබර් 28 දක්වා ඉවත් කිරීම.
9	2459/46	2025.10.24	2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 5 රෙගුලාසියට අනුකූල නොවන ලෙස

			ආනයනය කර ඇති මෝටර් වාහන හා සම්බන්ධ අධිකරණ කටයුත්තට අදාළව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද එකඟතා කොන්දේසි යටතේ එම වාහන ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීම සඳහා අවසර ලබා දීම.
10	2465/07	2025.12.01	දිට්වා සුළි කුණාටුවත් සමග ඇති වූ හදිසි අපදා තත්ත්වය හමුවේ විපතට පත්වූවන්ට විවිධ විදේශීය පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන භාණ්ඩ රේගු නිෂ්කාශනය කිරීමේදී අදාළවන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වලින් කොන්දේසි සහිත නිදහස් කිරීම් ලබා දීම සහ 1990 සුවසැරිය පදනමේ ඍජු භාවිතය සඳහා පරිත්‍යාග ලෙස හෝ ප්‍රදාන ලෙස ලැබෙන, වායු බැලුන නොමැති, ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2421/04 - 2025.01.27

2020.05.22 දිනැති අංක 2176/19 අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින්, තෝරාගත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කරන ලද වාහන ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. එකී තාවකාලික ආනයන අත්හිටුවීම, 2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304ක් යටතේ අඛණ්ඩව බල පැවැත්විණි.

2024.09.12 දිනැති අංක 24/1945/604/208 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව, ඉහත සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304 යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන ආනයනය සඳහා පනවා තිබූ තාවකාලික අත්හිටුවීම අදියර තුනකින් ඉවත් කිරීමට, 2024.09.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, එහි දෙවන අදියර යටතේ වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සඳහා 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2421/44 – 2025.01.31

මෝටර් වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීමේ තුන්වන අදියර ලෙස, පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා කාර්, වෑන් ආදි මෝටර් වාහන ද ඇතුළුව සංයෝජිත වර්ගීකරණ

සංකේතාංක 304 යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සඳහා බලපැවැත් වූ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම (2024.12.18 දිනැති අංක 2415/35 දරන සහ 2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයන් පරිච්ඡින්න කරමින්) සඳහාත් එම වාහන කාණ්ඩ අතුරින් උපරිම වයස් සීමාවන් ඉක්මවන ලද මෝටර් වාහන, ද්විත්ව පහර (Two-stroke) එන්ජින් සහිත ත්‍රී රෝද රථ සහ භාවිතා කළ පාපැදි අත්හිටවූ ආනයන පාලන බලපත්‍ර පාලනයට යටත් කිරීම සඳහාත් 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2428/07 - 2025.03.19

පරිපාලන හා ප්‍රමිති අවශ්‍යතාවයන් හේතුවෙන් ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීමේ දී එම වාහන සම්බන්ධයෙන් තාක්ෂණික සහ නිෂ්පාදිත තොරතුරු තහවුරු කර ගැනීම සඳහා අදාළ වාහනය අපනයනය කරනු ලබන රට තුළ ක්‍රියාත්මක, බලයලත් ආයතනයක් මගින් අපනයන පරීක්ෂණ සහතිකයක් ලබා ගත යුතු බවට 2006 ජූලි 21 දිනැති අංක 1454/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මුල් වරට රෙගුලාසි පනවන ලද අතර 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් එම රෙගුලාසි අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

කෙසේවෙතත්, ජපානයෙන් ආනයනය කරනු ලබන වාහන සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා බියුරෝ වෙරිටාස් ආයතනයට හැකි බව ඉහත කී 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සෘජුවම සඳහන් කර නොමැති බවට නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ජපානයෙන් ආනයනය කරනු ලබන වාහන සඳහා එම ආයතනය මගින් අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීම නීත්‍යානුකූල කිරීම සඳහා රෙගුලාසි සකස් කළ යුතු බවට හඳුනා ගනු ලැබිණි.

තවද, අපනයනය කරනු ලබන මෝටර් වාහනයට අදාලව 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ලේඛනයන්හි ණයවර ලිපිය විවෘත කරන දේශීය බැංකුවේ සහ අපනයනය කරනු ලබන රටේ නියෝජිත බැංකුවේ නිල මුද්‍රා සටහන් විය යුතු බවට රෙගුලාසියක් පනවා ඇති නමුත්, සමහර අවස්ථාවන් හි දී අපනයනය කරනු ලබන රටේ නියෝජිත බැංකුව විසින් අදාළ ලේඛනවල සිය නිල මුද්‍රාව තැබීමෙන් තොරව දේශීය බැංකුව වෙත ලේඛන නිදහස් කිරීම හේතුවෙන් එම රෙගුලාසි අනුව කටයුතු කිරීමට බාධා මතුව තිබුණි. ඒ අනුව, මාර්ගගත ක්‍රමවේද හරහා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාවේ වැඩි දියුණු වීම් මෙන්ම මාර්ගගත යාන්ත්‍රණයන් ඔස්සේ තොරතුරු සත්‍යාපනය කිරීමේ හැකියාවන් සැලකිල්ලට ගනිමින් කාලීන හා වඩාත් ප්‍රායෝගික ආකාරයෙන් කටයුතු කිරීම සඳහා හැකියාව ලැබෙන පරිදි, එකී රෙගුලාසි මගින් දක්වා ඇති අපනයන පරීක්ෂණ සහතිකය සහ උපාංග ලැයිස්තුව ඇතුළත් වාහනයේ සවිස්තරාත්මක තත්ත්ව පරීක්ෂණ වාර්තාව යන ලේඛනවල අපනයනය කරනු ලබන රටේ නියෝජිත බැංකුව විසින් නිල මුද්‍රාව තැබීමට අදාළව එම රෙගුලාසිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනු ලැබිණි.

ඉහත කරුණු ආවරණය වන පරිදි, පවතින රෙගුලාසි සංශෝධනය කිරීමට 2025 මාර්තු මස 14 වන දින භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේ දී ගනු ලැබූ තීරණය බලපැවැත්වෙන පරිදි 2025 අංක 03 දරන ආනයන හා අපනයන

(පාලන) රෙගුලාසි, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2434/12 – 2025.04.29

කොවිඩ්-19 වසංගතය හමුවේ ඇතිවූ අනපේක්ෂිත ආර්ථික තත්ත්වය හේතුවෙන් විදේශ සංචිත හා මූල්‍ය වෙළෙඳපොළ මත වැඩිවූ පීඩනය ලිහිල් කිරීමේ අරමුණින් තෝරාගත් භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ගනුලැබූ පියවරක් ලෙස ආනයන බලපත්‍ර පාලනය යටතේ ඇති තෝරාගත් අයිතම සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලදී.

2025 පෙබරවාරි 01 වන විට මෝටර් රථ ඇතුළු භාණ්ඩ ආනයනය කිරීම සඳහා පැවති තාවකාලික අත්හිටුවීම සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බැවින් කාලීන අවශ්‍යතාවය සළකා අත්හිටුවන ලද බලපත්‍ර අයිතම ලැයිස්තුව ද සමාලෝචනය කිරීමට අවධානය යොමු විය.

ඒ අනුව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව යන ආයතනවල නිලධාරීන් විසින් 2025 අප්‍රේල් 07 වන දින පැවති රැස්වීමේ දී, ආනයන පාලන බලපත්‍ර (ICL) නිකුත් කිරීම අත්හිටුවන ලද අයිතම ලැයිස්තුව සමාලෝචනය කරනු ලැබූ අතර කාලීන අවශ්‍යතාවය මත, පහත අයිතම සඳහා ඇති ආනයන පාලන බලපත්‍ර (ICL) නිකුත් කිරීම අත්හිටුවීම, ඉවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

i. 2025.01.27 දිනැති අංක 25/0070/826/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් භාවිතා කරන ලද රෙදිපිළි ආනයනය කිරීමට (අදියර වශයෙන්) අවසර දී ඇති බැවින්, භාවිතා කරන ලද රෙදිපිළි (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 6309.00.90)

ii. ඉදිරිපත්ව ඇති පුද්ගල ඉල්ලීම් සැළකිල්ලට ගෙන, මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සහ වාහන අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන වාහන අමතර කොටස් (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8408.20.10, 8408.90.10, 8707.10.50, 8707.10.90, 8707.90.90 සහ 8714.10.10)

iii. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ බලපත්‍ර ලබාගත් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයෝජකයින් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කරමින්, සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉවහල් වන කැසිනෝ ක්‍රීඩා උපකරණ හා සංචාරකයන් සඳහා පහසුකම් සපයන ස්ථානවල ඇති ක්‍රීඩා උපකරණ (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 9504.30.10, 9504.30.90 සහ 9504.90.10)

තවද, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෝටර් වාහන ආනයනය සඳහා පැවති තාවකාලික අත්හිටුවීම මුළුමනින්ම ඉවත් කිරීම සැලකිල්ලට ගෙන, ආනයනය තාවකාලිකව අත්හිටුවා තිබූ නමුත් 2022 වර්ෂයේ දී පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන්, ආනයන පාලන බලපත්‍ර (ICL) යටතේ ආනයනය කිරීමට අවසර ලබා දෙන ලද විද්‍යුත් යතුරුපැදි අතුරින් ඕනෑම රටක ලියාපදිංචි නොකළ විද්‍යුත් යතුරුපැදි ආනයනය සඳහා පනවා තිබූ ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කොට ඒවා 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන ගැසට් පත්‍රයේ විධිවිධානයන්ට යටත්ව ආනයනය කිරීමට අවසර ලබා දීමට සුදුසු බව තීරණය කරන ලදී.

ඒ අනුව, එකී තීරණ බලපැවැත්වෙන පරිදි 2025 අංක 04 දරන රෙගුලාසි, 2025 අප්‍රේල් 29 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2435/02 - 2025.05.05

අංක අමප/25/0663/804/078 හා 2025 අප්‍රේල් 07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ 2025 අප්‍රේල් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද පරිදි, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති ආදායම් සංරක්ෂණ නියෝග අනුව විද්‍යුත් වාහන සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම්, මෝටර් වාහන ආනයනය සඳහා අදාල වන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සඳහා ඇතුලත් කරමින් 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ 2025 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවා 2025 මැයි 05 දිනැති අංක 2435/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2437/04 - 2025.05.19

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින්, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 වර්ගීකරණය ලද ලුණු ආනයනය, ආනයන පාලන බලපත්‍ර පාලනයට යටත් කර ඇත.දේශීය වෙළෙඳපලේ පැවති ලුණු සුලභතාවය සීමා වීම සැලකිල්ලට ගනිමින් "ගෘහස්ත සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා අයඩීනීකරණය නොකළ අමු ලුණු සහ ආහාරයට ගත හැකි අයඩීනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය කිරීම" යන මැයෙන් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කල 2025 මැයි 15 දිනැති අංක 25/0797/817/021 දරන සංදේශය පිළිබඳව වූ 2025 මැයි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අවසර ලබා දුන් පරිදි, ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සංයෝංජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 යටතේ වර්ගීකරණය කර ඇති අමු අයඩීනීකරණය නොකළ ලුණු සහ ආහාරයට ගත හැකි අයඩීනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) 2025 ජුනි 10 දින දක්වා ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා 2025 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 මැයි 19 දිනැති අංක 2437/04 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2449/60 - 2025.08.15

“සංචාරක ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම” යන මැයෙන් හිටපු සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 අප්‍රේල් මස 01 දිනැති අංක 24/0644/615/003-I දරන සංදේශය පිළිබඳව වූ 2024 අප්‍රේල් මස 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, සංචාරක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද “වාහන ආනයන බලපත්‍රයක්” යටතේ සංචාරකයින් ප්‍රවාහනයේ සෘජු භාවිතය සඳහා පමණක් කුඩා ප්‍රමාණයේ බස් රථ හා බස් රථ 250ක් සහ වෑන් රථ 750ක් (SUV සහ කාර් හැර ආසන 6-15 ප්‍රමාණයක් ඇති ස්ලයිඩින් දොරවල් සහිත වෑන් රථ) ඇතුළුව නවීන මෝටර් රථ 1,000ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙමින් 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2024 මැයි මස 17 දිනැති අංක 2384/34 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම රෙගුලාසි 2025 ජුනි මස 30 දක්වා බලාත්මක විය.

මේ අතර, ඉහත කී කාල සීමාව 2025 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරමින් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කල 2025 ජූලි 24 දිනැති අංක 25/1339/807/016-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව 2025 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් එකී සංදේශය සඳහා වන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ වල දක්වා ඇති කොන්දේසි වලට යටත්ව 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල වලංගු කාලය 2025-07-01 දින සිට 2025-09-30 දින දක්වා මාස 03ක කාලයකින් දීර්ඝ කිරීමට අවසර ලබාදෙන ලද අතර එම අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා, 2025 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 අගෝස්තු මස 15 දිනැති අංක 2449/60 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2458/43 - 2025.10.15

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි අනුව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ග කරන ලද සහල් ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇත.

"වෙළෙඳපල හිඟයක් ඇති වන බව නිරීක්ෂණය වන සහල් වර්ගයන්හි ප්‍රමාණවත් සැපයුම සහතික කිරීම" යන මැයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කල 2025 ඔක්තෝම්බර් මස 10 දිනැති අංක 25/1942/817/013-XV දරන ඒකාබද්ධ සංදේශය පිළිබඳව වූ 2025 ඔක්තෝම්බර් මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල් ප්‍රභේදය ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

එම අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කරමින්, එක් අයෙකුට ආනයනය කල හැකි උපරිම සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 520ක් වීම, නෞභාර පත්‍රයේ නැව්ගත කිරීමේ දිනය 2025 ඔක්තෝම්බර් 15 සිට 2025 ඔක්තෝම්බර් 28 අතර වීම සහ 2025 නොවැම්බර් 15 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගැනීම යන කොන්දේසි වලට යටත්ව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල් ප්‍රභේදය ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා 2025 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 ඔක්තෝම්බර් 15 දිනැති අංක 2458/43 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2459/46 - 2025.10.24

භාවිතා කරන ලද මෝටර් වාහන ආනයනයේදී සැපිරිය යුතු කොන්දේසි දක්වමින් 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වල අංක 5 රෙගුලාසියට අනුකූල නොවන ලෙස ආනයනය කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් රඳවා තබා ගෙන ඇති මෝටර් වාහන සම්බන්ධව පවතින අධිකරණ කටයුත්තට අදාළව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද එකඟතා කොන්දේසි හා ඒ සම්බන්ධව අදාළ පාර්ශව සමග පැවති සාකච්ඡා වලින් අනතුරුව අධිකරණය ඉදිරියේ එකඟ වූ පරිදි 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 5 රෙගුලාසියට අනුකූල නොවන ලෙස ආනයනය කර ඇති මෝටර් වාහන, එකී කොන්දේසි යටතේ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට අවසර ලබා දීම සඳහා 2025 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/46 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2465/07 – 2025.12.01

දිට්වා සුළි කුණාටුවත් සමග ඇති වූ හදිසි අපදා තත්ත්වය හමුවේ විපතට පත්වූවන්ට විවිධ විදේශීය පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන භාණ්ඩ, බදු නිදහස් කිරීම්, සරල ක්‍රියාවලියක් හරහා ලබා ගැනීම, කඩිනම් නිෂ්කාශනය සහ බෙදා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සම්බන්ධව 2025.11.29 සහ 2025.11.30 යන දිනවල ජනාධිපති ලේකම් කාර්යාලයේදී අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීම් වලදී සාකච්ඡා කරන ලදී. ඒ අනුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ප්‍රකාශයට පත් කර ඇති මාර්ගෝපදේශ අනුව විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නමින් හෝ ඕනෑම රජයේ ආයතනයක නමින් ලැබෙන භාණ්ඩ වලට අදාළවන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වලින් (ආනයන පාලන බලපත්‍ර ලබාගැනීම්, ප්‍රමිතිකරණ තහවුරු කිරීම්) කොන්දේසි සහිත නිදහස් කිරීම් ද ලබා දියයුතු බවට තීරණය කරන ලදී.

මේ අතර, මෙම හදිසි අපදා තත්ත්වය හමුවේ ගිලන් රථ වල අවශ්‍යතාවය සම්බන්ධව 2025.12.01 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී පැවති රැස්වීමේදී අවධානය යොමු විය. එහිදී, 1990 සුවසැරිය පදනමේ ඍජු භාවිතය සඳහා පරිත්‍යාග ලෙස හෝ ප්‍රදාන ලෙස, වායු බැලුන නොමැති, ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ ලබා ගැනීම සඳහා එවකට සෞඛ්‍ය අමාත්‍යවරයාගේ '1990 සුවසැරිය පදනමට නොමිලේ ප්‍රදාන වශයෙන් ගිලන්රථ ලබා ගැනීම' යන මැයෙන් වූ 2024 ජූනි 18 දිනැති අංක 24/1261/610/048 දරන සංදේශය සඳහා ලබාදුන් 2024 ජූලි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අවසර දුන් වායු බැලුන නොමැති, ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ 150ක්, මේ අවස්ථාවේ ලබා ගැනීමට ද රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තීරණය කරන ලදී.

ඒ අනුව, එකී තීරණ බලපැවැත්වෙන පරිදි, 2025 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 දෙසැම්බර් 01 දිනැති අංක 2465/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

2.1.2 මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ප්‍රකාශිත ගැසට් නිවේදනයන්හි ඇතුළත් රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා රේගුව, වාණිජ බැංකු හා දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුම්වත් කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, ගැසට්පත්‍රයක් ප්‍රකාශයට පත්කරන සෑමවිටම අදාළ පාර්ශ්වයන්ගේ දැනුම්වත්භාවය උදෙසා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව, 2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් උපදෙස් 09 ක් හා අභ්‍යන්තර චක්‍රලේඛ 19 ක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

2.2. ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම

ආනයන හා අපනයන කටයුතු නියාමනය කරනු ලබන ආයතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන පාලනයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව, එකී කාර්යය විධිමත්ව හා ඵලදායිව සිදු කරමින් සේවාලාභීන් වෙත ගුණාත්මක සේවාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ඒකක 5 ක් ස්ථාපිතකර ඇති අතර, එම ඒකකයන් මගින් බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව 2025 වර්ෂයේදී එක් එක් ඒකකයන් විසින් නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

2.2.1. ඒකක 01 - ඖෂධ සහ වෛද්‍ය උපකරණ

ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රධාන කාණ්ඩ පහකට වර්ග කර ඇති අතර, එක් එක් කාණ්ඩය යටතේ 2025 වර්ෂයේදී නිකුත් කරන බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	බටහිර ඖෂධ	1000	1,359
2	පශු ඖෂධ	1010	436
3	ආයුර්වේද ඖෂධ	1020	120
4	හෝමියෝපති ඖෂධ	1030	10
5	වෛද්‍ය උපකරණ	1100	106
එකතුව			**2,031**

ඖෂධ සහ වෛද්‍ය උපකරණ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතෙහි 109 වන වගන්තිය ප්‍රකාරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලබා දෙන අනුමැතිය යටතේ, ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමට පෙර ගත යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග කිහිපයක් සහ ආනයන බලපත්‍ර සඳහා ඇතුළත් කළ යුතු විශේෂ කොන්දේසි මෙම ඒකකය විසින් හඳුනා ගන්නා ලදී. තව ද, 2025 වර්ෂයට අදාළව ලබා ගන්නා ලද සමූහ ආනයන බලපත්‍ර පිළිබඳ අධ්‍යයනය කරන ලද අතර, ඒ අනුව නිකුත් කිරීමට අදාළ කොන්දේසි සමාලෝචනය සහ පිළියෙල කිරීම සිදුකරන ලදී.

2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ නිකුත් කරන ලද මුළු බලපත්‍ර ප්‍රමාණය යම් වැඩිවීමක් සිදු වී ඇත.පෙර වර්ෂයේදී නිකුත් කරන ලද ආනයන හා අපනයන බලපත්‍ර ප්‍රමාණයට වඩා මාසිකව යම් ප්‍රමාණාත්මක වැඩිවීමක් 2025 වර්ෂය තුළ පෙන්නුම් කරන අතර, නව පරිගණක පද්ධතියක් අප ආයතනයට හඳුන්වා දීම හේතුවෙන් කඩිනමින් බලපත්‍ර ලබා ගැනීමේ අපේක්ෂාව සහිතව එක් බලපත්‍රයක් යටතේ ආනයනය කරන අයිතම ප්‍රමාණය ආනයනකරු විසින් සීමා කිරීම නිසා වැඩි ආනයන බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් විය. එමෙන්ම ආර්ථිකය ප්‍රසාරණය වීමත් සමඟ වැඩි ඖෂධ ප්‍රමාණයක් ආනයනය කිරීම ද මෙම වැඩිවීමට බලපා ඇත.



2.2.2 ඒකක 2 - භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්

මෙම ඒකකය මඟින් භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් හා වෙනත් අයිතම කිහිපයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර 2025 වර්ෂයට අදාළව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
01	තානාපති කාර්යාලය සඳහා වාහන	2030	01
02	ඉලෙක්ට්‍රික් මෝටර් සයිකල්	2210	35
03	ගිලන්රථ	2130	03
04	මෝටර් සයිකල්	2200	01
05	බයිසිකල්	2220	13
06	හෙල්මට්	2240	21
07	බොඩි ෂෙල්	2320	09
08	වැසි	2350	46
09	ගුවන් යානා සහ හෙලිකොප්ටර් අමතර කොටස්	2400	109
10	මිනිසුන් රහිත ගුවන්යානා	2410	45
11	බැලූන්	2420	01
12	පැරෂුට්	2430	02
13	නෞකා හා උපාංග	2500	08
	එකතුව		**294**

භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.3 ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සහ අපනයන අයිතමයන් සඳහා 2025 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

	විස්තරය	කාණ්ඩ අංකය	බලපත්‍ර සංඛ්‍යාව
01	අන්තරායකර රසායනික ද්‍රව්‍ය	3000	466
02	කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය, කෘමිනාෂක	3010	1665
03	පොහොර	3020	11
04	කාබනික අපද්‍රව්‍ය	3030	233
05	විකිරණශීලී ද්‍රව්‍ය	3040	108
06	ඛනිජ තෙල්/ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ද්‍රව පෙට්‍රෝලියම් වායු	3100	1282
07	මද්‍යසාර	3200	193
08	ලෝහ, ලෝහ සුන්බුන් අපනයන	3400	235
09	ලෝහ, ලෝහ සුන්බුන් ආනයන	3500	30
එකතුව			**4223**

රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය, අපනයන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර



2.2.4 ඒකක 4 -ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්

2025 වර්ෂයේදී ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා පහත පරිදි ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
01	පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි	4000	53
02	ඉරන ලද ලී හා ලී කුට්ටි (අපනයන)	4010	99
03	භාවිත කරන ලද පරිගණක	4040	03
04	භාවිත කරන ලද ශීතරකණ හා වායු සමීකරණ	4050	01
05	තාප පොම්ප	4060	09
06	ශීත කාරක වායු	4080	181
07	නවින වායු සමීකරණ යන්ත්‍ර	4090	106
08	විදුලි පේනු සහ කෙවිනි	4100	45
09	දුරස්ථ පාලකයන් මඟින් ක්‍රියාකරන සෙල්ලම් බඩු	4110	20
10	සිගරට් කඩදාසි	4120	63
11	භාවිත කරන ලද ගෘහ භාණ්ඩ	4130	01
12	කියත්	4140	113
13	මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර	4150	202
14	ක්‍රීඩා යන්ත්‍ර හා වාසනා උරගා බැලීමේ ක්‍රීඩා යන්ත්‍ර	4170	09
15	සන්නිවේදන උපාංග	4200	1182
16	ජංගම දුරකථන	4300	2498
17	භාවිත කරන ලද ඇඳුම්	4400	40
එකතුව			**4625**

ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.5 ඒකක 5- සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන

සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන සඳහා පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
01	සජීවී සතුන්	5000	28
02	ආහාරයට ගනු ලබන මස්වර්ග හා ආශ්‍රිත නිෂ්පාදන	5010	154
03	සත්ත්ව ආහාර	5020	2475
04	ලූණු	5100	40
05	සීනි	5110	13
06	ශීතකළ මසුන්	5200	149
07	මාළු ඇම	5210	04
08	ටින්කල මාළු	5220	12
09	ලෙලි කජු	5300	70
10	ධාන්‍ය වර්ග	5310	135

11	සහල්	5320	21
12	නිවුඩ්ඩ සහිත සහල්	5330	01
13	පාම් තෙල්	5340	86
14	ශක්තිජනක පාන	5400	39
15	තේ	5410	748
16	රත්‍රං	5500	30
	එකතුව		**4005**

සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.6 2025 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර - මාසිකව

මාසය	ඒකක 1	ඒකක 2	ඒකක 3	ඒකක 4	ඒකක 5	එකතුව
ජනවාරි	202	10	246	399	177	**1034**
පෙබරවාරි	149	32	363	392	233	**1169**
මාර්තු	137	35	424	405	295	**1296**

අප්‍රේල්	149	27	340	328	303	**1147**
මැයි	136	15	303	335	323	**1112**
ජූනි	188	20	317	403	379	**1307**
ජූලි	195	17	436	418	391	**1457**
අගෝස්තු	184	24	378	392	385	**1363**
සැප්තැම්බර්	158	27	359	404	372	**1320**
ඔක්තෝබර්	148	22	385	463	398	**1416**
නොවැම්බර්	168	31	379	328	353	**1259**
දෙසැම්බර්	217	34	293	358	396	**1298**
එකතුව	**2031**	**294**	**4223**	**4625**	**4005**	**15178**



2.2.7 පසුගිය වසර 4තුළ නිකුත් කරන ලද ආනයන අපනයන පාලන බලපත්‍ර

	අයිතමය	2021	2022	2023	2024	2025
ඒකක 01	ඖෂධ	2,255	1,832	1,945	1,583	2031
ඒකක 02	වාහන හා අමතර කොටස්	284	647	385	640	294
ඒකක 03	රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයනය	4,313	3,653	4,256	4,881	4223
ඒකක 04	ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්	8,982	4,231	5,218	6,136	4625
ඒකක 05	සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන	3,742	3,443	3,282	3,770	4005
එකතුව		**19,576**	**13,806**	**15,086**	**17,010**	**15,178**

2.3 වසර 3ක් තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

2.3.1 ඖෂධ සහ වෛද්‍ය උපකරණ - ඒකක 1

	විස්තරය	වර්ෂය		
		2023	**2024**	**2025**
01	බටහිර ඖෂධ	1365	914	1,359
02	පශු ඖෂධ	309	404	436
03	ආයුර්වේද ඖෂධ	179	175	120
04	හෝමියෝපති ඖෂධ	14	10	10
05	වෛද්‍ය උපකරණ	78	80	106
එකතුව		**1945**	**1583**	**2031**

මූලා‍ය ද්‍රවශීලතාවය ඉහළ යෑම සහ විනිමය අනුපාතිකය අඛණ්ඩව ශක්තිමත් වීම හේතුවෙන් 2024 වසරට සාපේක්ෂව 2025 වර්ෂයේදී නව බලපත්‍ර නිකුත් කිරීම දළ වශයෙන් වැඩි වී ඇත. පශු ඖෂධ, වෛද්‍ය උපකරණ , බටහිර ඖෂධ සහ හෝමියෝපති ඖෂධ යන කාණ්ඩ හැර ආයුර්වේදීය ඖෂධ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරේ.

2022 වර්ෂයට සාපේක්ෂව, 2023 වර්ෂයේදී නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව ඉහළ ගොස් ඇතත් , 2024 වසරේ නිකුත් කර ඇති නව බලපත්‍ර සුළු වශයෙන් පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්වන අතර නැවත 2025 වසරේ නිකුත් කර ඇති නව බලපත්‍ර සංඛ්‍යාව ඉහල යෑමත් සමඟ සාමාන්‍යකරණය වන බව පෙනේ.

2024 වර්ෂයේ නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණයට (1583) වඩා 2025 වර්ෂයේ නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය (2031) 28% ක පමණ ප්‍රතිශාත්මක වැඩීමක් වන අතර , 2025 වර්ෂයේදී අළුතින් හඳුන්වා දුන් මාර්ගගත පද්ධතිය (Stratlink) මඟින් කාර්යක්ෂමව හා ප්‍රමාදයන්ගෙන් තොරව බලපත්‍ර ලබා දීම හා ආර්ථිකයේ සිදු වූ වෙනස් වීම ද ඒ සඳහා හේතුවී ඇත.

සමස්තයක් ලෙස ගත් කළ, ආනයනයේදී පනවා තිබූ විවිධ පාලන කොන්දේසි ලිහිල් කිරීම සහ විදේශ සංචිතවල වර්ධනය නිසා නැවත ඖෂධ සමාගම් විසින් මෙරට ඖෂධ අවශ්‍යතාවය හිඟයකින් තොරව සපුරාලීමට පෙළඹී ඇති බව පෙනේ.

2.3.2 භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් - ඒකක 2

අංකය	විස්තරය	වර්ෂය		
		2023	2024	2025
01	තානාපති කාර්යාලය සඳහා වාහන	-	-	01
02	විදේශගත සේවා ආයතන සඳහා පරිත්‍යාග	02	06	-
03	සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග	07	09	-
04	විශේෂ කාර්ය වාහන	-	01	-
05	මෝටර් ට්‍රේලර් (පාවිච්චි කළ)	02	-	-
06	කෘෂිකාර්මික අංශය සඳහා වන පාවිච්චි කල ට්‍රැක්ටර්	02	01	-
07	ගුවන් යානා සහ අමතර කොටස්	96	187	109
08	එන්ජින්	03	02	-
09	යන්ත්‍ර සහ උපාංග	05	02	-
10	බොඩි ෂෙල්	25	38	09
11	පාවිච්චි කල මෝටර් බයිසිකල්	01	02	01
12	ඉලෙක්ට්‍රික් මෝටර් සයිකල්	138	154	35
13	බයිසිකල්	18	13	13
14	හෙල්මට්	21	30	**21**
15	වැඩි	59	168	46
16	ආසන (පාවිච්චි කළ වාහන ආසන)	03	03	-
17	පාවිච්චි කළ ඇඳුම්	03	24	-
18	ගිලන්රථ	-	-	03
19	මිනිසුන් රහිත ගුවන් යානා	-	-	45
20	බැලුන්	-	-	01
21	පැරෂුට්	-	-	02
22	නෞකා හා උපාංග	-	-	08
	එකතුව	**385**	**640**	**294**

මෙම දෙපාර්තමේන්තුව මගින් විද්‍යුත් යතුරු පැදි සඳහා ආනයන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවය 2025.04.29 දිනැති අංක 2434/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව ඉවත් කරන ලද බැවින් 2025 වර්ෂයේ මුල් මාස 04 ක කාලය තුළ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය 35ක් ලෙස දැක්වේ. ඒ අනුව, විද්‍යුත් යතුරු පැදි සඳහා 2025 වර්ෂයේ දී නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණයේ 2024 වර්ෂයට සාපේක්ෂව 77% ක පමණ අඩු වීමක් නිරීක්ෂණය වේ. 2025 වර්ෂය ආරම්භයේ සිට නිෂ්පාදිත දින සිට වසර 03ක කාලය නොඉක්ම වූ වාහන බලපත්‍ර පාලනයෙන් තොරව ආනයනය සඳහා අවසර ලබා දීමත් සමග දේශීය වශයෙන් එකලස් කරනු ලබන වාහන (බොඩි ෂෙල්) සඳහා ලබා ගන්නා ආනයන බලපත්‍ර සංඛ්‍යාව 2024 වර්ෂයට සාපේක්ෂව 76% ක පමණ අඩුවීමක් නිරීක්ෂණය වේ.

2025 වර්ෂයේ සිට කාණ්ඩ අංක 2350 (දේශීය වශයෙන් එකලස් කරනු ලබන යතුරු පැදි) යටතේ සිදු කරනු ලබන ආනයනයන් සඳහා නාමමාත්‍ර ඉන්වොයිසි කිහිපයකට එක් බලපත්‍රයක් ඉල්ලුම් කරන ලෙසට ආනයනකරුවන් දැනුවත් කිරීම හේතුවෙන් 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂය තුළ එම කාණ්ඩය යටතේ නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාවේ 73 % ක පමණ අඩුවීමක් ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් අදාල බලපත්‍ර සංඛ්‍යාවේ 73% ක අඩුවීමක් නිරීක්ෂණය වුව ද මෙම කාණ්ඩය යටතේ ආනයනය කර ඇති යතුරු පැදි සංඛ්‍යාවේ 12% ක පමණ වැඩිවීමක් සිදු වී ඇති බව ද නිරීක්ෂණය වේ.

එමෙන්ම, ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා බාහිර ආයතන වෙතින් ලබා ගන්නා නිර්දේශයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් ලබා ගැනීමට කටයුතු කර ඇති බැවින් ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වඩාත් විධිමත්ව සිදු කිරීමේ හැකියාව වැඩිදියුණුවී ඇති බව ද නිරීක්ෂණය වේ.

2.3.3 රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයන හා අපනයන - ඒකක 3

	විස්තරය	වර්ෂය		
		2023	**2024**	**2025**
01	අන්තරායකර රසායනික ද්‍රව්‍ය	508	508	466
02	කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය, කෘමිනාෂක	1743	1940	1665
03	පොහොර	-	-	11
04	කාබනික අපද්‍රව්‍ය	46	99	233
05	විකිරණශීලී ද්‍රව්‍ය	253	182	108
06	ඛනිජ තෙල් නිෂ්පාදන	1075	1452	1282
07	මද්‍යසාර	250	229	193
08	ප්ලාස්ටික් ආහාර බඳුන්	-	01	-
09	ලෝහ, ලෝහ සුන්බුන් අපනයන	213	317	235
10	ලෝහ, ලෝහ සුන්බුන් ආනයන	168	153	30
	එකතුව	**4256**	**4881**	**4223**

ආනයනය කරනු ලබන අන්තරායකර රසායනික ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන, විකිරණශීලි ද්‍රව්‍ය, මධ්‍යසාර, කර්මාන්ත සඳහා අවශ්‍ය අනෙකුත් රසායනික, වෙනත් අමුද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ලෝහ සුන්බුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඒකක 3 මගින් සිදු කෙරේ.

බලපත්‍ර හා හරපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහා නව පරිගණක යෙදවුමක් හඳුන්වා දීමත්, ඒ අනුව අප දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා රේගුවත් එකිනෙකට සම්බන්ධවීමත් හේතුවෙන් පැවැති ක්‍රමවේදය විධිමත්වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කරන ලදී. තෝරාගත් බලපත්‍ර කාණ්ඩයක් සඳහා සමූහ බලපත්‍ර

නිකුත් කිරීමට පියවර ගැනීම, එක් බලපත්‍රයක් සඳහා නාමමාත්‍ර ඉන්වොයිසි කිහිපයක් ඇතුළත් කිරීමට අවස්ථාව සලසා දීම හේතුවෙන් 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ප්‍රමාණාත්මකව යම් අඩු අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2.3.4 ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් - ඒකක 4

	විස්තරය	වර්ෂය		
		2023	**2024**	**2025**
01	පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි	153	207	53
02	ඉරන ලද ලී හා ලී කුට්ටි (අපනයන)	65	108	99
03	භාවිත කරන ලද පරිගණක	09	04	03
04	භාවිත කරන ලද ශිතරකණ හා වායු සමීකරණ	01	-	01
05	තාප පොම්ප	10	16	09
06	ශිත කාරක වායු	99	99	181
07	නවින වායු සමීකරණ යන්ත්‍ර	228	167	106
08	ක්‍රීඩා යන්ත්‍ර හා වාසනා උරගා බැලීමේ ක්‍රීඩා යන්ත්‍ර	-	07	09
09	විදුලි පේනු සහ කෙවිනි	65	79	45
10	දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු	74	91	20
11	සිගරට් කඩදාසි	49	69	63
12	භාවිත කරන ලද ගෘහ භාණ්ඩ	03	01	01
13	කියත්	17	102	113
14	මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර	142	210	202
15	සන්නිවේදන උපාංග	1175	1205	1182
16	ජංගම දුරකථන	3128	3770	2498
17	කාලගුණ බැලුම්	-	01	-
18	භාවිත කරන ලද ඇඳුම්	-	-	40
එකතුව		**5218**	**6136**	**4625**

ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, , කීයත්, දුරස්ථ පාලක සෙල්ලම් බඩු, වෙඩි බෙහෙත්, වායු රයිෆල් වැනි අයිතම ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ඉරන ලද ලී හා ලී කුට්ටි අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකය මගින් සිදුකරනු ලැබේ.

2025 වර්ෂයේදී බලපත්‍ර හා හරපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහා නව පරිගණක යෙදවුමක් හඳුන්වාදුන් අතර දෙපාර්තමේන්තුවත් ශ්‍රී ලංකා රේගුවත් ඒකිනෙකට සම්බන්ධ වීමත් හේතුවෙන් පැවති ක්‍රම වේදය විධිමත් වීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වේ. ඒ අනුව, 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ 4300 කාණ්ඩය (ජංගම දුරකථන (පාවිච්චි කළ / අලුත්)) සඳහා නිකුත් කරන ලද එක් බල පත්‍රයක් සඳහා නාමමාත්‍ර ඉන්වොයිසි කිහිපයක් ඇතුළත් කිරීමට අවස්ථාව සලසා දීම හේතුවෙන් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ප්‍රමාණාත්මකව අඩු අගයක් ගැනීමට හේතු වූ බව නරීක්ෂණය වේ.

2025.02.04 දිනැති අමප/25/0070/826/001 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම සැලකිල්ලට ගනිමින් පාවිච්චි කළ ඇඳුම් ආනයනය පාලනය කිරීම සඳහා වාර්ෂික කෝටා ක්‍රමයක් හඳුන්වා දීමටත්, එම ක්‍රමවේදය යටතේ වසර තුනක කාලයක් තුළ භාවිත කරන ලද සියලුම වර්ගයේ ඇඳුම් (උණුසුම් ඇඳුම් ඇතුළුව) ආනයනය ක්‍රමානුකූලව නතර කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2025 වර්ෂය සඳහා පාවිච්චි කළ ඇඳුම් ආනයනය සඳහා ආනයන බලපත්‍ර 40 ක් නිකුත් කර ඇත.

2.3.5 සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන - ඒකක 5

	විස්තරය	වර්ෂය		
		2023	2024	2025
01	සජීවී සතුන්	1642	2222	28
02	ආහාරයට ගනු ලබන මස්වර්ග හා ආශ්‍රිත නිෂ්පාදන	-	-	154
03	සත්ත්ව ආහාර	-	-	2475
04	ලූණු	26	27	40
05	සීනි	07	17	13
06	ශීතකළ මසුන්	293	278	149
07	ශීතකළ දැල්ලන්	-	02	-
08	මාළු ඇම	-	-	04
09	ටින්කල මාළු	-	-	12
10	ලෙලි කජු	01	36	70
11	ධාන්‍ය වර්ග	193	174	135
12	සහල්	120	173	21
13	නිවුඩ්ඩ සහිත සහල්	-	-	01

14	පාම් තෙල්	54	61	86
15	ශක්තිජනක පාන	51	55	39
16	තේ	500	687	748
17	රත්‍රං	37	37	30
18	රෙදි	-	01	-
19	සකස් කරන ලද පිටි පිෂ්ඨය මෝල්ට්	358	-	-
එකතුව		**3282**	**3770**	**4005**

2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂය තුළ නිකුත් කර ඇති මුළු බලපත්‍ර සංඛ්‍යාව ඉහළ අගයක් පෙන්වන අතර, කාණ්ඩ වශයෙන් සැලකීමේදී ඇතැම් කාණ්ඩ සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව 2024 වර්ෂය හා සැසඳීමේදී අඩු අගයක් ගනී.

අමප/25/0406/808/027 අංක හා 2025.03.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් 2025 ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා බඩඉරිඟු මෙට්‍රික්ටොන් 300,000 ක් සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා ආනයන බලපත්‍ර ලබාදීමට අනුමැතිය ලබා දී ඇති අතර, ඒ සඳහා කාණ්ඩ අංක 5020 යටතේ ආනයන පාලන බලපත්‍ර 2475 ක් නිකුත් කරන ලද අතර, එම බලපත්‍ර ප්‍රමාණය 2024 වර්ෂයට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දේශීය පරිභෝජනය සඳහා ලෙලි කජු මෙට්‍රික් ටොන් 5,000 ක් සඳහා ආනයන බලපත්‍ර ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බැවින් මේ සඳහා ලබා දී ඇති බලපත්‍ර ප්‍රමාණය 2024 වර්ෂය හා සැසඳීමේදී වැඩි අගයක් ගෙන ඇත.

කාණ්ඩ අංක 580 යටතේ තේ කොළ ආනයනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව 2024 වසරේ 687 ක් ද, 2025 වර්ෂයේ 748 ක් ලෙසත් පෙන්නුම් කෙරෙන අතර, එය මෙම කාණ්ඩය තුළ සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

කාණ්ඩ අංක 505 යටතේ ලූණු ආනයනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව 2024 වසරේ 27 ක් ද, 2025 වර්ෂයේ 40 ක් ලෙසත් පෙන්නුම් කෙරෙන අතර, එය මෙම කාණ්ඩය තුළ සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2024 වර්ෂයේ කාණ්ඩ අංක 515 යටතේ සීනි සඳහා ආනයන බලපත්‍ර 17 නිකුත් කර ඇති නමුත් 2025 වර්ෂයේ කාණ්ඩ අංක 5110 යටතේ 13 ලෙසත් පෙන්නුම් කරන අතර එය 2024 වසරට සාපේක්ෂව අඩු අගයක් ගනී.

අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2024 වසරට දේශීය පරිභෝජනය සඳහා සහල් ආනයන බලපත්‍ර ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.2025 වසරේ sticky rice පමණක් ආනයනය කර ඇති බැවින් 2024 වර්ෂය හා සැසඳීමේදී අඩු අගයක් ගෙන ඇත.

2.4 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග

වාණිජ අරමුණින් සිදුකරනු ලබන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු නියාමනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ වෙනුවෙන් ගෙවීම් ක්‍රම රෙගුලාසි, අංක 1739/03 හා 2012.01.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර, එම ගෙවීම් ක්‍රම පහත සඳහන් වේ. තවද, මෙම ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිරන්තරයෙන් නිකුත් කරනු ලැබේ.

1. පෙර ගෙවීම් (**Advanced Payments -AP)**
2. පිළිගැනීම මත ලේඛන (**Documents against Acceptance - DA)**
3. ණයවර ලිපි (**Letters of Credit - LC)**
4. ගෙවීම් මත ලේඛන (**Documents against Payment -DP)**
5. විවෘත ගිණුම් (**Open Accounts - OA)**
6. භාණ්ඩ විකුණා මුදල් ගෙවීමේ පදනම (**Payments on Consignment Account Basis)**
7. විදේශ විනිමය වැය නොවන පදනම මත **(Non Foreign Exchange -NFE)**

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් 2025 වර්ෂය තුළදී ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් අංක **1739/03** දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසිවලට අදාළ වන අනුමැතීන්/ අවිරෝධතාවයන් පහත පරිදි වේ.

2025 වර්ෂයේ දී ඒකක 02 මගින් ලබාදෙන ලද අනුමැතීන්							
මාසය	පෙර ගෙවීම (ඇ.ඩො. 50000, වැඩි)	පිළිගැනීම මත ලේඛන සඳහා වන ගෙවීම	විවෘත ගිණුම් මත ගෙවීම	පුනර් අපනයන	ආනයන සඳහා කරන ලද කල් ඉකුත් වූ පෙර ගෙවීම්වලට ලබා දෙන අනුමැතීන්	වෙනත්	මුළු එකතුව
ජනවාරි	01	23	14	07	12	05	**62**
පෙබරවාරි	04	30	24	05	10	02	**75**
මාර්තු	09	39	30	03	09	05	**95**
අප්‍රේල්	04	32	29	02	02	02	**71**
මැයි	01	20	21	02	05	02	**51**
ජූනි	03	30	21	03	16	04	**77**
ජූලි	02	47	19	11	13	00	**92**

අගෝස්තු	01	40	18	01	16	02	**78**
සැප්තැම්බර්	04	44	25	01	06	03	**83**
ඔක්තොම්බර්	10	63	31	01	15	04	**124**
නොවැම්බර්	04	61	32	02	11	01	**111**
දෙසැම්බර්	07	45	22	02	22	06	**104**
මුළු එකතුව	**50**	**474**	**286**	**40**	**137**	**36**	**1023**

2.5. ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමනය හා පහසුකරණය

2.5.1 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම

න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි මෙන්ම ඒවා රැගෙන යාමට භාවිත කළ හැකි ඉලක්කගත ක්‍රම (delivery systems) ව්‍යාප්ත වීම අන්තර්ජාතික සාමය හා ආරක්ෂාවට බරපතළ තර්ජනයක් ලෙස සැලකේ. එම නිසා එවැනි අවි හෝ ඒවාට අදාළ ද්‍රව්‍ය අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, මාරු කිරීම, ප්‍රවාහනය කිරීම හෝ භාවිත කිරීම සඳහා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට (non-state actors) කිසිදු ආකාරයක සහායක් ලබා නොදීම රාජ්‍යයන්ගේ මූලික වගකීමකි.

ඒ වෙනුවෙන් සැකසුනු එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නීතිමය හා පරිපාලනමය විධිවිධාන පැනවීම අත්‍යවශ්‍ය වේ. මෙම යෝජනාව යටතේ න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි හා ඒවාට සම්බන්ධ ද්‍රව්‍ය සාමකාමී අරමුණු සඳහා පමණක් අපනයනය, ප්‍රති-අපනයනය, Transit සහ නැව් මාරු කිරීම (Trans-shipment) අදාළ ජාතික නීති හා පාලන ක්‍රමවේද අනුව සිදු විය යුතු බව අවධාරණය කරයි. එහෙත්, මෙම අවශ්‍යතා සම්පූර්ණයෙන් ඉටු කිරීමට ප්‍රමාණවත් පරිදි විශේෂිත නීතිමය රාමුවක් මෙරට තුළ නොවූ බැවින්, ශ්‍රී ලංකාව විසින් උපායමාර්ගික භාණ්ඩ වෙළඳ පාලනය සඳහා විධිමත්, එකිනෙක හා සම්බන්ධ හා නවීන නීතිමය රාමුවක් ස්ථාපිත කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

මෙවැනි අන්තර්ජාතික වගකීම් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය, වගවීම හා විශ්වාසනීයත්වය තවදුරටත් ශක්තිමත් කරන අතර, ජාතික ආරක්ෂාව, වෙළෙඳ ස්ථාවරභාවය, විදේශ ආයෝජන ආකර්ෂණය සහ ව්‍යාපාර පහසුකම් වැඩිදියුණු වීම වැනි ප්‍රතිලාභ රැසක්ද රටට ලබා දීමට දායක වේ.

ඉහත අවශ්‍යතාවයන් සලකා බලා, 1540 යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දී ඇත. එමෙන්ම, යෝජනාව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය නීතිමය සහ තාක්ෂණික සහාය සැපයීම සඳහා, රාජ්‍ය ආයතන නියෝජිතයන්ගෙන් සමන්විත නීති සම්පාදන කමිටුවක් සහ තාක්ෂණික කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පත් කරන ලදී.

තාක්ෂණික කමිටුව විසින් ජාත්‍යන්තර අත්දැකීම් (international best practices) සැලකිල්ලට ගනිමින් යුරෝපා සංගම් යුධ උපකරණ ලැයිස්තුව (EU Military List) සහ යුරෝපා සංගම් ද්වි-භාවිත පාලන ලැයිස්තුව (EU Dual-Use Control List) ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් සකස් කිරීම සම්පූර්ණ කර ඇත. මෙම ලැයිස්තු ජාතික පාලන ලැයිස්තුවක් සකස් කිරීම සඳහා මූලික පදනමක් ලෙස මෙම ලැයිස්තු දෙක භාවිත කිරීමට යෝජිතය.

කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලියට අදාළ මුල් අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 දී ලබා දී තිබීම හේතුවෙන්, එය යාවත්කාලීන කිරීම සහ වර්තමාන ප්‍රතිපත්ති පරිසරයට අනුකූල කිරීම අවශ්‍ය බව නීති කෙටුම්පත් සම්පාදක විසින් නිරීක්ෂණය කර ඇත. ඒ අනුව සකස් කරන ලද නව අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා 2023 ජනවාරි මාසයේදී අනුමැතිය ලබා දී ඇත.

ඉදිරියේදී 1540 යෝජනාව සම්පූර්ණයෙන් හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය පදනම සැපයීමට උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත (Strategic Trade Management Act) කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. මෙම පනත් කෙටුම්පත සකස් කිරීමේදී, 1540 යෝජනාවට අදාළ විෂය විශේෂඥයන්ගේ නිරීක්ෂණ, ආසියා-ශාන්තිකර කලාපයේ රටවල ක්‍රියාත්මක උපායමාර්ගික වෙළෙඳ පාලන නීති, සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන් සවිස්තරාත්මකව අධ්‍යයනය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදාළව සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ ශ්‍රී ලංකාවේ තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අදාළව ද, ශ්‍රී ලංකා උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත කෙටුම්පත් කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත. තවද, එම පනත යටතේ පාලනය කිරීමට යෝජිත උපායමාර්ගික අයිතම සම්බන්ධයෙන් යුරෝපා සංගම් යුද උපකරණ ලැයිස්තුව හා ද්වි-භාවිත පාලන ලැයිස්තුව පදනම් කරගනිමින් ජාතික පාලන ලැයිස්තුවක් සකස් කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම, දැනට නීති කෙටුම්පත් සම්පාදකගේ නිරීක්ෂණ අනුව අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නැවත ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කටයුතු කිරීමට නියමිතය. මෙම පනත සම්මත කිරීම ශ්‍රී ලංකාවේ උපායමාර්ගික වෙළෙඳ පාලන පද්ධතිය සම්පූර්ණ හා කාර්යක්ෂම රාමුවක් වෙත උසස් කිරීමේ වැදගත් පියවරක් වනු ඇත.

2.5.2 පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය (Pre-Shipment Inspection Certificate)

භාවිත කළ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී එම වාහන නියමිත වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂක මිනුම් ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කළ යුතු බැවින්, ඒ සඳහා පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු බලයලත් පරීක්ෂණ ආයතන ඇතුළත් කර 2013 අප්‍රේල් මස 04 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර තිබේ.

2020 වර්ෂයේ සිට වාහන ආනයනය, කොවිඩ් -19 ගෝලීය වසංගතය නිසා ඇති මුල්‍යමය අර්බුදය හේතුවෙන් තාවකාලිකව අත්හිට වූ අතර, මෙම හේතුව නිසා වාහන සඳහා වන පූර්ව නැව්ගත පර්යේෂණ සහතික නිකුත් කරනු ලබන බලයත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩි කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතා තිබුණි.

කෙසේ වෙතත්, 2024 වර්ෂය වන විට රට තුළ ඇති වූ මුල්‍යමය අර්බුදකාරි තත්ත්වය ක්‍රමිකව ප්‍රකෘති තත්ත්වයට පත්වීමත් සමඟ, වාහන ආනයනය පිළිබඳ රජයේ අවධානය යොමු කරමින්, යම් යම් වාහන කාණ්ඩ ආනයනය සඳහා පැවති තාවකාලික තහනම ඉවත් කරනු ලැබීමත් සමඟ, පූර්ව නැව්ගත පරීක්ෂණ සහතික නිකුත් කිරීමේ ආයතන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා වූ ක්‍රියාවලිය නැවත පණගන්වමින්, 2019 දී විශේෂ තාක්ෂණ කමිටුව මඟින් තෝරාගත් ආයතන වෙතින් නැවත යෝජනා කැඳවා, පසුව සුදුසු ආයතන තෝරා ගැනීම සඳහා වන මූලික ක්‍රියාමාර්ග සකස් කරනු ලැබිය.

2025 වර්ෂයේ මුල් කාර්තුව තුළ එම ආයතන තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කරන ලද අතර ඒ අනුව තෝරාගෙන ඇති ආයතන සමග ගිවිසුම්ගත වීම සඳහා සුදුසු ගිවිසුමක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඉන්පසු බලයලත් ආයතන ප්‍රසිද්ධ කිරීම සඳහා ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. එමඟින් ඉදිරියේදී ආනයනකරුවන්ට, වාහන ආනයනයේ දී මුහුණපෑමට සිදුවන දුෂ්කරතා අවම කරගැනීමට හා ඒවා මිලදී ගන්නා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාවද තහවුරු කරගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

2.5.3. ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන ආනයන කරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීමේ ගැසට් නිවේදනය

ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන නියෝග උල්ලංඝනය කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීම, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන්ම පාරිසරික සුරක්ෂිතතාව තහවුරු කිරීමේ සමාජ වගකීම ඉටු කිරීමේ දර්ශකයකි. එබැවින් ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතින්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන නියෝග උල්ලංඝනය කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීමට අදාළ විධිවිධාන මේ යටතේ සලසා ඇත.

ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද රෙගුලාසි කෙටුම්පත අංක MF/IED/003/CM/2025/063 හා 2025.06.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා විසින් ලබා දී තිබූ නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත්ව අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් අංක අමප/25/1108/804/131 හා 2025.07.22 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය මගින් දැනුම් දෙන ලදී.

එම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ද සැලකිල්ලට ගනිමින් අදාළ රෙගුලාසි නැවත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර, නීති කෙටුම්පත් සම්පාදක විසින් ගැසට් නිවේදනය සංශෝධනය කිරීමෙන් පසු නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ගෙන ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමට ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිතය.

2.5.4 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම හා ආනයන හා අපනයන බලපත්‍ර කොන්දේසි සමාලෝචනය කිරීම.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන බලපත්‍ර සඳහා, නිර්දේශ ලබාදෙන ආයතන නිශ්චිත ලෙස හඳුනා ගැනීමත්, එම නිර්දේශ ලබාදෙන ආයතනවලට අයත් අයිතම නිවැරදි ලෙස හඳුනාගැනීමත්, එමඟින් අදාළ අයිතම ආනයනය සඳහා, එම අදාළ ආයතන මඟින්ම, පැහැදිළි නිර්දේශයන් නිකුත් කිරීම අරමුණු කර ගනිමින් ඉහත සඳහන් ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම ආරම්භ කරන ලදි.

එහි මූලික පියවර ලෙස, ආදාළ ආනයන බලපත්‍ර නිකුත් කරනු ලබන ඒකක මඟින් එක් එක් බලපත්‍ර අයිතතම සඳහා සාම්ප්‍රදායිකව නිර්දේශ නිකුත් කරනු ලබන ආයතන වෙන වෙනම හඳුනාගන්නා ලද අතර, එම ආයතන පිළිබඳ ගැටළු සහිත අවස්ථා හඳුනා ගැනීම හා එම ගැටළු නිරාකරණය සඳහා ඒ ඒ නිර්දේශ ලබා දෙන ආයතන මෙම දෙපාර්තමේන්තුව වෙත කැඳවා සාකච්ඡා පවත්වීම සිදු කරන ලදී. ඒ අනුව, එම ආයතන මඟින් පමණක් ආනයන බලපත්‍ර සඳහා නිර්දේශ ලබා ගැනීමට හැකි වන පරිදි නව ක්‍රමවේදයක් සකස් කරන ලදි.

ඒ අනුව, අදාළ නිර්දේශ ලබා දීමේ ක්‍රමවේදය වඩාත් විධිමත් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති STRATLINK ඩිජිටල් පද්ධතිය මගින් මාර්ගගතව නිර්දේශ ලබා ගැනීම සඳහා අදාළ නිර්දේශ ලබා දෙන ආයතන සමග අවබෝධතා ගිවිසුම් වෙත එළඹීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

2.6 නව වැඩිදියුණු කිරීම්

2.6.1 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කර ඇති STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතියේ ප්‍රගතිය



2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ රාජ්‍ය ආයතන සඳහා වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි සඳහන් කරුණු හා නිර්දේශ සළකා බැලීමේදී STRATLINK පද්ධතියෙහි දත්ත වෙත ප්‍රවේශ වන පාර්ශ්ව සමඟ ගිවිසුම් වලට එළඹීම අත්‍යවශ්‍ය කරුණක් වන බව තවදුරටත් හඳුනා ගත් අතර, ඒ අනුව STRATLINK පද්ධතිය හා සම්බන්ධ වන පාර්ශ්වකරුවන් වන ආනයන හා අපනයන පාලන බලපත්‍ර ලබාදීමේදී නිර්දේශ ලබාදෙන රාජ්‍ය ආයතන 25 ක් සමඟ ඔවුන්ගේ කාර්යභාර්ය පිළිබඳව අවබෝධතා ගිවිසුම් (Memorandum of Understanding – MOU) වලට එළඹීම සිදුකර ඇත.

මේ වන විට මෙම දෙපාර්තමේන්තුව සමඟ ගනුදෙනු කරන නිත්‍ය ගනුදෙනුකරුවන් 99% ම 2025 වර්ෂය වන විට STRATLINK පද්ධතිය තුළ ලියාපදිංචිය සම්පූර්ණ කර ඔවුනොවුන්ගේ ආනයන හා අපනයන බලපත්‍ර මාර්ගතව ඉතා පහසුවෙන් ලබා ගනිමින් සිටී.

එසේම බලපත්‍ර ගාස්තු සහ අතිරේක ගාස්තු ගෙවීම්, රාජ්‍ය ගෙවීම් වේදිකාව (Lanka Pay Payment Platform) හරහා ඉතා ඉක්මනින් සිදුකිරීමේ පහසුකම සේවාලාභීන්ට හිමිවන අතර 24 x7 ගෙවීම් සිදුකිරීමට මේ වන විට පහසුකම ලැබී තිබේ.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව අතර පද්ධති ඒකාබද්ධ කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇති අතර ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය සමඟ STRATLINK පද්ධතියේ බලපත්‍ර තොරතුරු ස්වයංක්‍රියව හුවමාරු වේ. ඒ අනුව, බලපත්‍ර තොරතුරු ශ්‍රී ලංකා රේගුව වෙත යොමු වන අතර බලපත්‍ර හරකිරීමට අවශ්‍ය වන රේගු ප්‍රකාශන (Customs Declarations) තොරතුරු ASYCUDA පද්ධතිය මඟින් STRATLINK පද්ධතිය වෙත ලැබීමෙන් පසු නිෂ්කාෂණය සඳහා වන අනුමැතීන් ශ්‍රී ලංකා රේගුව වෙත ස්වයංක්‍රියව STRATLINK පද්ධතිය මඟින් යොමුකරනු ලැබේ.

2.6.2. STRATLINK පද්ධතියේ ඉදිරි සංවර්ධන කටයුතු

STRATLINK පළමු අදියරේදී හඳුනාගන්නා ලද පද්ධති වැඩිදියුණු කිරීම් සිදුකිරීම 2026 වර්ෂයේදී එහි දෙවන අදියරේදී සිදුකිරීමට සැලසුම් කර ඇත.

ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත තනි කවුළු ව්‍යාපෘතිය (National Single Window) හා සම්බන්ධ වීමට අමතරව ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC- National Cyber Security Operation Centre)හා සම්බන්ධවීමෙන් සයිබර් තර්ජන වලින් පද්ධතියට ඇතිවිය හැකි බලපෑම අවම කර කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ලබාදීමට කටයුතු සැලසුම් කර ඇත.

3 පරිච්ඡේදය -

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධන

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	සත්‍ය 2025 රු.	සත්‍ය 2024 රු.	
-	ආදායම් ලැබීම්		4,154,003,841	3,762,583,369	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
3,315,000,000	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-		ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	4,154,003,841	3,762,583,369	ඒසීඒ-1
3,315,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		4,154,003,841	3,762,583,369	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		164,186,000	128,344,250	ඒසීඒ-3
-	තැන්පතු		579,458	488,608	ඒසීඒ-4
5,000,000	අත්තිකාරම් ගිණුම		8,569,220	6,338,278	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		102,951,541	19,880,000	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**276,286,219**	155,051,136	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**4,430,290,060**	3,917,634,505	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		4,111,797,087	3,763,676,594	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		318,492,973	153,957,911	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
97,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	93,492,622	76,542,418	ඒසීඒ-2(ii)
88,345,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	68,249,014	53,042,340	ඒසීඒ-2(ii)
1,200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	725,802	814,457	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
186,545,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**162,467,438**	130,399,215	
	මූලධන වියදම්				
3,755,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	1,685,969	1,380,382	ඒසීඒ-2(ii)
105,452,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	104,725,889	20,350,483	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
2,200,000	හැකියා වර්ධනය	14	1,111,326	602,588	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
111,407,000	**මුළු මූලධන වියදම් (උ)**		**107,523,184**	22,333,453	
	තැන්පතු ගෙවීම්		1,993,310	338,265	ඒසීඒ-4
8,000,000	අත්තිකාරම් ගෙවීම්		10,220,448	7,913,434	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		12,213,758	8,251,699	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		282,204,379	160,984,367	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		36,288,593	(7,026,456)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		36,288,593	(7,026,456)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සතය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	188,149,874	83,327,235
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	18,631,403	16,880,175
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**206,781,277**	**100,207,410**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,487,839	15,422,759
දේපළ පිරියත හා උපකරණ සංචිතය		188,149,874	83,327,235
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	100,000	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	43,564	1,457,416
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**206,781,277**	**100,207,410**

පිටු අංක **7** සිට **37** දක්වා ඒසීඒ **1** සිට ඒසීඒ **7** දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **38** සිට **45** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026.02.20	දිනය : 2026.02.20	දිනය : 2026.02.20

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

ආනයන හා අපනයන පාලන ...

එච්.ඒ.සී.පී. ධර්මරත්න
ප්‍රධාන ගණකාධිකාරි
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහ	සංශෝධිත
	2025 රු.	2024 රු.
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	4,111,739,694	3,762,583,369
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	647,701	19,880,000
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	6,101,629	4,158,551
අග්‍රිම ලැබීම්	164,186,000	128,344,250
අත්තිකාරම් අයකර ගැනීම්	8,080,618	7,474,212
තැන්පතු ලැබීම්	579,458	488,608
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**4,291,335,099**	**3,922,928,990**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	161,741,636	127,853,087
සහනාධාර සහ මාරුකිරීම්	725,802	814,457
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	2,797,295	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	285,173	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,111,797,087	3,763,676,594
අත්තිකාරම් ගෙවීම්	10,220,448	7,913,434
තැන්පතු ගෙවීම්	1,993,310	338,265
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**4,289,560,751**	**3,900,595,837**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,774,347**	**22,333,153**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	104,725,888	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**104,725,888**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(104,725,888)**	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(102,951,541)**	**22,333,153**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	102,951,541	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**102,951,541**	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**102,951,541**	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**0**	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස
1001.03.00	ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු	3,800,000	3,315,000	4,154,004	125%

3.4.1 පසුගිය වර්ෂ 4 ක ආනයන හා අපනයන පාලන බලපත්‍ර සහ අතිරේක ගාස්තුවල වටිනාකම

රු. '000

වර්ෂය	2022	2023	2024	2025
ශුද්ධ ආදායම	3,086,778	3,304,992	3,762,583	4,154,004



දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 3 ක බලපත්‍ර ආදායම පිළිබඳව සලකා බැලීමේදී ආදායමේ ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබේ. 2025 වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 4.15ක ඉහළ ආදායමක් ඉපයීමට සමත් වී ඇති අතර එය 2024 වර්ෂයට සාපෙක්ෂව 10.4%ක වැඩි වීමකි.

ආර්ථිකය ප්‍රසාරණය වීම, නව පරිගණක පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිවීම හේතුවෙන් නිකුත් කරන බලපත්‍ර ප්‍රමාණය වැඩිවීම හා ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරන ලද අවස්ථාවලදී දඩ මුදල් අයකිරීමට කටයුතු කිරීම් ආදී හේතු බලපත්‍ර ආදායම වැඩිවීම කෙරෙහි බලපා ඇත.

3.5 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	187,000	186,545	162,467	87%
ප්‍රාග්ධන	8,000	8,455	4,572	54%
ප්‍රාග්ධන - (විදේශීය ප්‍රදාන - 13)	-	102,952	102,952	100%

3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන නොමැත.

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය**	**31.12.2025 දිනට මූලය තත්ත්ව වාර්තාව අනුව ශේෂය**	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	89,476,036.17	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	98,673,837.92	-	-

9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.8 විගණකාධිපති වාර්තාව (ඇමුණුම 1)

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිතදර්ශක	අපේක්ෂිතනිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිපත්ති නියාමනය කිරීම	ගැසට් නිවේදන මඟින් රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම	√		
	මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම	√		
	අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම	√		
මෙහෙයුම් කටයුතු	ආනයන හා අපනයන පාලන බලපත්‍ර හා හර පත්‍ර නිකුත් කිරීම	√		
මූල්‍ය කළමනාකරණය	අක්මුදල් අවශ්‍යතා සැළැස්ම	√		
	ආදායම් එකතු කිරීමේ සැලැස්ම	√		
අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය	අභ්‍යන්තර විගණන පරීක්ෂණ		√	
	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	√		
	මූලික වාර්තා ඉදිරිපත් කිරීම	√		
	ත්‍රෛමාසික ඇගැයීම් වාර්තා පිළියෙල කිරීම	√		
පරිගණක පද්ධතිය හඳුන්වා දීම	STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම	√		

ප්‍රසම්පාදන කළමනාකරණය	භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා ක්‍රියාත්මක කිරීම			√
මානව සම්පත් කළමනාකරණය	පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම		√	

5 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත්කර ගැනීමේ කාර්යසාධනය

2015 වර්ෂයේ පැවැති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක රාජ්‍ය නායකයන් විසින් ගෝලීය වශයෙන් 2030 වසරේදී ළඟා විය යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් සහ ඉලක්ක 169 ක් හඳුන්වා දෙන ලදී. තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙහි මානවයා, මිහිකත සහ සෞභාග්‍යය වෙනුවෙන් වන්නා වූ ක්‍රියාකාරී සැලසුම්, පුළුල් නිදහස තුළ විශ්වීය සාමය ශක්තිමත් කිරීමේ වැයම්, අන්ත දරිද්‍රතාවය ඇතුළු දිළිඳු බවෙහි ස්වරූපයන් තුරන් කිරීම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන්, ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ක්‍රියාකාරිත්වය යනාදිය ඇතුළත් කර ඇත.

ගෝලීය තිරසර සංවර්ධන අරමුණු (SDGs) සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ ජාතික ප්‍රවේශයට අනුගත වීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස, තිරසර සංවර්ධන සභාව අනුග්‍රහයෙන් පවත්වන ලද වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වූ අතර, එමඟින් දිගුකාලීන සංවර්ධන උපායමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවබෝධය තවදුරටත් වර්ධනය විය.

පසුව දෙපාර්තමේන්තු අභිලාෂයන් මුදුන්පත් වන පරිදි දිගුකාලීන දැක්මකින් යුතුව තිරසර සංවර්ධන අරමුණු හා එහි ප්‍රගතිය මැනීම සඳහා වූ නිර්ණායකයන් ස්ථාපිත කර ගන්නා ලදී. ස්ථාපිත කරගත් අරමුණු තුළින් රටේ තිරසර සංවර්ධනය සඳහා වූ කාලීන අවශ්‍යතාවය සැපිරීම උදෙසා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. දෙපාර්තමේන්තුවට අදාළව අරමුණු සකස් කර ගැනීමේදී පාදක කරගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 11)

ජීවත්වීම උදෙසා හිතකර පරිසරයක් රට තුළ ගොඩනැගීම සඳහා වාතයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකළ යුතුය. නාගරීකරණය වූ ප්‍රදේශවල රථවාහන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයන්හි වාතයේ අඩංගු විමෝචන වායුප්‍රතිශතයේද

වැඩිවීමක් දක්නට ඇත. මෙහිදී අවධානයට ලක් වූ කරුණ නම් රථවාහනවලින් පිටවන විෂ දුමාරය මඟින් සැළකිය යුතු මට්ටමක වායු දූෂණයක් සිදුවන බවයි. එබැවින් වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන ආනයනය කිරීම නවතා ඇත. ඒ සඳහා 2019.01.25 දිනැති අංක 2107/45 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් රෙගුලාසි පනවා ඇති අතර, එම රෙගුලාසි අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 12)

පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමෙන් රජය අපේක්ෂා කරන සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව නියාමන ආයතනයක් ලෙස කටයුතු කරයි. එලෙස බලපෑම් ඇතිකරනු ලබන අයිතම හඳුනාගෙන ඒවා පාලනය හා නියාමනය කිරීම සඳහා ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම, ආනයනය හා අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සහ ආනයන හා අපනයනයට අදාළ ප්‍රමිති නියම කිරීම අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් නිසියාකාරව සිදුකරනු ලබයි.

ඒ අනුව, පරිසර අමාත්‍යාංශය විසින්, 2023 ජනවාරි මස 31 දිනැති අංක 23/0265/622/003 දරන "තනි භාවිත ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය පාලනය" යන මැයෙන් වූ ඔවුන්ගේ අමාත්‍ය මණ්ඩල සටහනේ දක්වා ඇති යෝජනා සඳහා ලබා ගන්නා ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව, 2023 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ප්ලාස්ටික්වලින් නිර්මිත එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් බීම බට, කැලතීමේ උපකරණ , පිඟන්, කෝප්ප (යෝගට් කෝප්ප හැර), යෝගට් හැඳි ඇතුළු හැඳි, ගෑරුප්පු, පිහි සහ ප්ලාස්ටික් මල්මාලා, ප්ලාස්ටික් ඉඳිආප්ප වට්ටි ආනයනය කිරීම කිරීම, 2023 අප්‍රේල් මස 06 දිනැති අංක 2326/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තහනම් කරනු ලැබූ රෙගුලාසි තවදුරටත් ක්‍රියාත්මක වේ.

ඊට අමතරව, 2024 වර්ෂයේ දී සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304ක් යටතේ වන ආනයනික භාණ්ඩ සඳහා ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසී පනවමින් 2024 මැයි මස 17 දිනැති 2384 / 35 අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරනු ලැබූ මෙම රෙගුලාසි අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. මෙහිදී සෘජුවම මනුෂ්‍ය පරිභෝජනයට ගනු ලබන, ආහාර වර්ග මෙන්ම උපකරණ හා උපාංග බොහොමයක් සඳහා ප්‍රමිති තත්ත්වයන් අනිවාර්ය කර ඇත.

තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකටම ඵලදායී, වගකීම් සහිත පූර්ණ ආයතන ගොඩනැගීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 16)

සියලුම මට්ටම්වල නිලධාරින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත්, එම තීරණ නිරන්තර ඇගයීමට භාජනය කිරීමෙන් ඉහළ සඵලත්වයක් තහවුරු කරගැනීමත් දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. කාර්ය මණ්ඩල රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් හරහා සියලුම මට්ටම්වල නිලධාරින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව හවුල් කරවා ගැනීමෙන් ඵලදායී වගවීමෙන් යුක්ත හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබී ඇත.

පවත්නා නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පූර්ණ වශයෙන් තහවුරු වන ආකාරයට දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පහසුකම් එකී පාර්ශ්වයන් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉතා වගවීමෙන් සහ ඉතා ඉක්මනින් ඉල්ලුම් කරන පාර්ශ්වයන්ගේ අතට පත් කරනු ලබන අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ද යාවත්කාලීන තොරතුරු වෙතට පිවිසීමේ හැකියාව සලසා දී ඇත.

තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය (තිරසර සංවර්ධන අරමුණු අංක 17)

රජය විසින් අපේක්ෂා කරනු ලබන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට, ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. මේ යටතේ, රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය නිසියාකාරව සිදු වීම තහවුරු කිරීම, ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ඇති රෙගුලාසි බලගැන්වීම හා ශක්තිමත් කිරීම යන අරමුණු සුවිශේෂී වේ. එහිදී ඒක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල ප්‍රඥප්ති 1540 මෙන්ම වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (**Trade Facilitation Agreement**) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම හා සංගතභාවය තුළින් ජගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම යන තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟාකර ගැනීම සිදුකරනු ලබයි. 1540 යෝජනාව 2023 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. ඊට සමගාමීව ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ වඩාත් වඩාත් සඵලදායිව ඉටුකරනු වස් ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය හා සම්බන්ධව **STRATLINK** පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා **STRATLINK** පරිගණක පද්ධතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ මූලික මට්ටමේ පුහුණු කිරීම් එස්තෝනියා රජයේ නියෝජිතයින් විසින් සිදු කරන ලදි. ඒ අනුව, 2024.10.25 දින **STRATLINK** පරිගණක පද්ධතිය නිල වශයෙන් දියත් කරන ලද අතර, ආනයන අපනයන පාලන බලපත්‍ර සහ හර පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ 2025 වර්ෂයේ දී සම්පූර්ණ වශයෙන් නිකුත් කිරීමට පියවර ගන්නා ලදී.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම.	1.ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන නිෂ්කාශනය කිරීමට ඉඩ නොදීම.			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදනරටාව න් සහතික කිරීම.	12.4 2020 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතික වැඩ සැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමඟින් මානව සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම.	2. බාසල් සම්මුතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම.			✓
		3. අදාළ අධිකාරියේ නිර්දේශය මත පාලනය කරන ලද අයිතම ගණන.			✓
		4. ඇල්මක් ඇති පාර්ශ්වයන් සමග පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන.	✓		
		5. මාණ්ඩලික නිලධාරින් සමඟ පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන.		✓	
		6. දැනුවත් කිරීම් සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් ගණන.	✓		
	12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම.	7. විද්‍යුත් අපද්‍රව්‍ය ආනයනය අඩු කිරීම සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද රෙගුලාසි ගණන.	✓		
		8. ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාවිතා කළ ඉලෙක්ට්‍රොනික අයිතම ගණන			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%- 49%	50%- 75%	76%- 100%
		(ජංගම දුරකථන, පරිගණක ආදිය).			
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	16.7 සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලු දෙනා අන්තර්ගතවූ, සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.	9. පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීම් ගණන.		✓	
		10. පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන.		✓	
	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම.	11. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කළ ඉල්ලීම් මත දින 14 ක් තුළ ලබාදුන් පිළිතුරුගණන.			✓
		12.තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ වරින් වර පළ කරන ලද වාර්තා, සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන ගණන.	✓		

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
17. තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය	17.1. බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය.	එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා (UNSCR) 1540 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම.		✓	
	17.16. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශ්වයන්ගේ හවුල්කාරිත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම.	STRATLINK පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව වෙත ඇති කාර්යභාරය ඉටු කිරීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීමට සිදුවේ. එහිදී, යම් යම් කාර්යයන් එම රාජ්‍ය ආයතනවලට පැවරෙන අතර, එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ඉලක්ක සැපිරීම කෙරෙහි තීරණාත්මකව බලපානු ලබයි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන අතර, එය මුහුණ දීමට සිදුව ඇති තවත් අභියෝගයකි. දෙපාර්තමේන්තුව මහත් පරිශ්‍රමයක් දරමින් මෙම අභියෝගයන් ජයගැනීමට කටයුතු කරමින් සිටියි.

පසුගිය කාලය තුළ ඇති වූ ආර්ථික අර්බුදය සහ විදේශ සංචිත ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා පනවා තිබූ ආනයන අපනයන පාලන සීමාවන් මේ වන විට ඉවත් කර ඇත. යම් මට්ටමකට ජාතික ආර්ථිකය යහපත් අතට හැරී ඇති අතර, විදේශ සංචිත ප්‍රමාණයේ යම් වර්ධනයක් දක්නට ලැබේ. ඒ මත පදනම්ව ජන ජීවිතය වඩාත් පහසු කරවීම උදෙසා ආනයන අපනයන පාලන සීමා බොහෝ දුරට ඉවත් කරනු ලැබීය. රථවාහන ආනයනයේ සමහර කොටස් හැරුණු විට අනෙකුත් ආනයන නිදහස් කිරීම තුළින් පරිභෝජන රටාවන්හි යම් ලිහිල් වීමක් දක්නට ලැබුණු අතර, කර්මාන්ත අංශයේ වර්ධනයක් ඇති වීමට ද එය හේතු විය.

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආනයන හා අපනයන නියාමනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම/ හර කිරීම සහ ආදායම් එක් රැස් කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා තම සක්‍රිය දායකත්වය ලබා දෙන අතර, වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත සැපයීම සඳහා වගවීමෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ 2025.12.31 දිනට සේවක සංඛ්‍යා විස්තරය පහත පරිදි වේ.

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	14	12	02
තෘතීයික	04	03	01
ද්විතීයික	84	74	10
ප්‍රාථමික	20	15	05
එකතුව	**122**	**104**	**18**

6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

දෙපාර්තමේන්තුවේ පවත්නා සේවක පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත අවස්ථා කිහිපයකදී ඉල්ලීම් සිදු කර ඇත. තව ද මානව සම්පත් හිඟය සම්පූර්ණ කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

I. මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු වන නියෝජ්‍ය පාලක/ සහකාර පාලක තනතුරු 06ක් පැවතිය ද දැනට සේවයේ නියුතුව සිටිනුයේ 04 දෙනෙකු

පමණි. එම පුරප්පාඩු සපුරන තෙක් වැඩ බැලීමේ පදනම මත හෝ නිලධාරීන් ලබා දෙන ලෙස ලේකම්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇත.

II. අනුමත රියදුරු තනතුරු සංඛ්‍යාව 5ක් වන අතර දැනට දෙදෙනෙකු පමණක් සේවයේ නියුතුව සිටියි. පුරප්පාඩු සපුරන ලෙස ඉල්ලීම් කර ඇතත් මෙතෙක් සපුරා නොමැති බැවින් දැනට මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ එක් රියදුරෙකු තාවකාලිකව පදනමින් මෙම දෙපාර්තමේන්තුවේ සේවය සඳහා යොදවා ගනිමින් දුෂ්කරතා මැද වුවද දෙපාර්තමේන්තුවේ රාජකාරීමය ප්‍රවාහන අවශ්‍යතා කළමනාකරණය කර ගෙන යනු ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා සෘජුව බැදෙන පහත සඳහන් කර ඇති වැඩසටහන්/පාඨමාලා සඳහා සේවකයන් යොමු කරවන ලදී .

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
සැපයුම්දාම කළමණාකරණය - සිංගප්පූරුව	01	2025.07.13 සිට 2025.07.19 දක්වා	-	ඇ.ඩො. 175	විදේශීය	අනාගත සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ නවතම දැනුම හා ප්‍රායෝගික ලබා ගැනීම මඟින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය පුළුල්වීම මත ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකි වීම.
අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF) විසින් පවත්වාගෙනන යනු ලබන – දකුණු ආසියානු ප්‍රාදේශීය පුහුණු තාක්ෂණික සහාය මධ්‍යස්ථානය (SARTTAC) මඟින් සංවිධානය කරන ලද ෆින්ටෙක් (FINTECH) වෙළඳපොළ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහ ඉන්දියාව	01	2025.07.13 සිට 2025.07.19 දක්වා	-	ඇ.ඩො. 175	විදේශීය	ෆින්ටෙක් (FINTECH) වෙළඳපොළ සංවර්ධනය හා ඒ සම්බන්ධ ප්‍රතිපත්තිමය බලපෑම් පිළිබඳ නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය පුළුල්වීම

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා වැඩසටහන (ITEC) මඟින් සංවිධානය කරන ලද ප්‍රමිති, නියමයන් සහ ලෝක වෙළඳ සංවිධානය යටතේ සෞඛ්‍ය හා ශාක සෞඛ්‍ය පියවරයන් (SPS) සහ තාක්ෂණික වෙළෙඳ බාධාවන් (TBT) පිළිබඳ පුහුණු පාඨමාලාව. – ඉන්දියාව	01	2025.07.15 සිට 2025.07.26 දක්වා	-	ඇ.ඩො. 300	විදේශීය	ආනයන හා අපනයන පාලන නියමයන් හා ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සැළකිල්ලට ගත යුතු ජාත්‍යන්තර වෙළෙඳ හා තාක්ෂණික සබඳතා හා තර්ජන පිළිබඳ නිලධාරීන්ගේ අබබෝධය පුළුල් වීම.
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය විනය	02	2025.11.03 සිට 2025.11.19 දක්වා	-	ඇ.ඩො. 750 + පවුම් 150	විදේශීය	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය පුළුල් වීම.
නව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සම්බන්ධ පුහුණුව	01	පැය 06	රු. 14,000.00	-	දේශීය	නව රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිය හඳුනා ගැනීම සහ අදාළ පුහුණු වැඩසටහන් හදාරා ලබා ගත් දැනුම, ක්‍රමවේද හා ප්‍රායෝගික අවබෝධය, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව, හා සඵලදායි ලෙස ඉටු කිරීමට හැකියාව ලැබීම .

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
Advance Excel & Google Tools	37	පැය 02		-	දේශීය	නිලධාරින්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම, නවීන පරිගණක තාක්ෂණය දෛනික රාජකාරි කටයුතු වලට අදාළ කර ගැනීමෙන් අත්වන වාසි සම්බන්ධව දැනුම්වත් කිරීම
Diploma in Diplomacy & World Affairs	2	සතියකට පැය 4 බැගින් වසර 02ක්	රු. 320,000.00	-	දේශීය	ජාත්‍යන්තර සම්බන්ධතා, ප්‍රතිපත්ති විශ්ලේෂණය, සාකච්ඡා හා සන්නිවේදන සම්බන්ධ නිපුණතා වර්ධනය වන අතර, දෛනික කාර්යයන් සිදු කිරීමේදී නියෝජිත කාර්යයන් කාර්යක්ෂමව, ප්‍රායෝගිකව සහ සඵලදායී ලෙස ඉටු කිරීමට නිලධාරීන්ගේ දැනුම හා වෘත්තීයභාවය ඉහළ යාම.
Master OF Information Security Degree Program	1	වසර 2ක්	රු. 615,000.00	-	දේශීය	සේවා ව්‍යවස්ථාවේ සුදුසුකම් සපුරාලීම සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ශක්තිමත් කරමින්, ඩිජිටල් සේවා වල විශ්වාසනීයත්වය සහ කාර්යසාධනය ඉහළ නැංවීම.

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ආනයන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබාදීම	23	පැය 03	රු. 1,800.00	-	දේශීය	ආනයන හා අපනයන පාලන පනත සහ ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම
අල්ලස හා දූෂණය පිටුදැකීම පිළිබඳ පුහුණුව-I කණ්ඩායම	32	පැය 02	-	-	දේශීය	අල්ලස් හා දූෂණය සම්බන්ධ නීති සහ වගකීම් පිළිබඳ අවබෝධය ලබා දීම, සහ අල්ලස හා දූෂණයට රාජ්‍ය නිලධාරීන් යොමුවීම අධෛර්යමත් කිරීම, මෙන්ම කාර්ය මණ්ඩලයේ විනය, වෘත්තීයභාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
රාජ්‍ය වත්කම් කලමනාකරණය පිළිබඳ පුහුණුව	1	පැය 06	රු. 14,000.00	-	දේශීය	රාජ්‍ය වත්කම් කළමනාකරණයේ නව ප්‍රවණතා සහ නීතිමය අවබෝධය ලබා දීම, වත්කම් නඩත්තු කිරීම, සුරක්ෂිතභාවය වැඩි කිරීම, දෝෂ වැළැක්වීම, වාර්තාකරණ හා විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කිරීම.
අල්ලස හා දූෂණය පිටුදැකීම පිළිබඳ පුහුණුව-II කණ්ඩායම	27	පැය 02	-	-	දේශීය	අල්ලස් හා දූෂණය සම්බන්ධ නීති සහ වගකීම් පිළිබඳ අවබෝධය ලබා දීම, සහ අල්ලස හා

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
						දූෂණයට රාජ්‍ය නිලධාරීන් යොමුවීම අධෛර්යමත් කිරීම, මෙන්ම කාර්ය මණ්ඩලයේ විනය, වෘත්තීයභාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
ලංසු ඇගැයීම සම්බන්ධ පුහුණුව	3	පැය 02 මිනිත්තු 30	-	-	දේශීය	නිවැරදි නෛතික රාමුවක් තුළ, මිනුම් ක්‍රම, විශ්ලේෂණාත්මක කුසලතා සහ ප්‍රායෝගික ක්‍රියාවලි පිළිබඳ අවබෝධය හා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කාර්යයන් කාර්යක්ෂමව, හා සඵලදායි ලෙස ඉටු කිරීමට දැනුවත් වීම
Stratlink පද්ධතියේ කටයුතු සමාලෝචනය කිරීම	20	පැය 06	රු. 52,579.56	-	දේශීය	Stratlink පද්ධතිය මඟින් ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ දී මතුවන ගැටළු හඳුනාගැනීම හා ඒ සඳහා විසඳුම් සාකච්ඡා කිරීම
ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාපටිපාටිය සම්බන්ධ වැඩසටහන.	30	පැය 02	රු. 2,800.00	-	දේශීය	ඖෂධ සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ දී, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාපටිපාටින් පිළිබඳව දැනුම්වත් කිරීම

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
සෞඛ්‍ය හා සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවෙ ක්‍රියාපටිපාටින් පිළිබඳ දැනුවත් කිරීම	37	පැය 02	රු. 6,000.00	-	දේශීය	සෞඛ්‍ය හා සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන ආනයන පාලන බලපත්‍ර ලබා දීමේ දී එම දෙපාර්තමේන්තුවේ ක්‍රියාපටිපාටින් පිළිබඳ දැනුම්වත් කිරිම
ආණ්ඩුවේ වැඩකටයුතු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය	10	පැය 02 මිනිත්තු 30	-	-	දේශීය	ආණ්ඩුවේ වැඩකටයුතු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමේදී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම
උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණය(STM)	23	පැය 02	-	-	දේශීය	උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණය පිළිබඳව දැනුවත්භාවයක් ලබා දීම
ප්‍රති-අපනයනය සම්බන්ධ වැඩසටහන	27	පැය 02	රු. 3,600.00	-	දේශීය	ප්‍රති-අපනයනයන් කිරීමේ දී සිදුවන ක්‍රියා පටිපාටින් පිළිබඳ අවබෝධයක් ලබාදීම
ගිනි ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන	2	පැය 04	රු. 9,440.00	-	දේශීය	හදිසි අවස්ථාවක ඇතිවන ගින්නකින් වන අවදානම වැළැක්වීම හෝ අවධානම අඩු කරගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
තිරසාර සංවර්ධන ඉලක්ක	28	පැය 02 මිනිත්තු 30	රු. 3,400.00	-	දේශීය	තිරසර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එහි වැදගත්කම සම්බන්ධ මූලික අවබෝධය ලබාදීම හා ආයතනයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට මෙම ඉලක්ක යොදා ගැනීම සම්බන්ධ අවබෝධය ලබා දීම
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය	50	පැය 2	-	-	දේශීය	1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව අවබෝධයක් ලබා දීම.
කාර්යාල ක්‍රම සම්බන්ධ වැඩසටහන	43	පැය 03	රු. 12,000.00	-	දේශීය	කාර්යාලයේ දෛනික කටයුතු කාර්යක්ෂම හා සඵලදායී ලෙස ඉටු පිණිස කාර්යාල ක්‍රමයන්හි ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාදීම.
Stratlink පද්ධතියේ කටයුතු සමාලෝචනය කිරීම	12	පැය 03	-	-	දේශීය	Stratlink පද්ධතිය භාවිතා කිරීමේදී මතුවන ගැටළු හඳුනාගැනීම හා ඒ සඳහා විසඳුම් සාකච්ඡා කිරීම
මොන්ට්‍රියල් සම්මුතිය සම්බන්ධව දැනුම්වත් කිරීම.	100	පැය 05	-	-	දේශීය	මොන්ට්‍රියල් සම්මුතිය හා පාලන යාන්ත්‍රණය සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම.
Stratlink පරිගණක පද්ධතිය ඔස්සේ මාර්ගගතව ලබා දෙන ආනයනය හා අපනයන	13	පැය 08	-	-	දේශීය	Stratlink පරිගණක පද්ධතිය හරහා ආනයන හා අපනයන පාලන බලපත්‍ර

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
පාලන බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දෙනු ලබන ආයතන සමඟ පැවැති පුහුණු වැඩමුළුව						ලබාදීමේ දී නිර්දේශ ලබා දෙන ආයතනයන් වෙත මුහුණ පෑමට සිදුවන ප්‍රායෝගික ගැටළු හඳුනා ගැනීම ඒ සඳහා විසඳුම් ලබාදීම.

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම් (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	ඒකක/ අංශ විසින් නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් නොකිරීම	අප්‍රමාදව පිළිතුරු ලබා දෙන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලදී.
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණකමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	ගර්හිත වාහන කිසිවක් නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති චක්‍රලේඛ අංක 2016/30දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3:1ඡේදයේ සඳහන් විධි විධාන	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු ගිණුම් සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය අත්හිටවූ සහ තනතුර අතහැර ගියාසේ සලකන ලද නිලධාරීන්ගේ ණය ශේෂ පැවතීම	නීතිමය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13	පොදු තැන්පත් ගිණුම්			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් අග්‍රිම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්. තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනතාවගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛනයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	2023.11.30 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) ප්‍රකාරව අදාළ නොවේ.		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ජේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ජේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

සමාප්ති සටහන

පසුගිය වර්ෂවල මුහුණ දුන් ආර්ථික අර්බුදකාරි තත්ත්වය, ක්‍රමිකව ස්ථාවර වීමත් සමඟ, 2025 වර්ෂයේදී රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ හා වෙළඳ පහසුකම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවලට අනුකූලව බහුතරයක් වූ ආනයන සීමා ඉවත් කිරීමට කටයුතු කරන ලදී. ඒ සමඟම, දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙන යමින්, තිරසර සංවර්ධනය හා ගෝලීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව, ඩිජිටල්කරණය මූලික කරගත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුගතව බලපත්‍ර ගාස්තු ගෙවීම් ආදී සේවාවන් මෙන්ම, ආනයනයට පසුව හර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය හරහා 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර, සේවාලාභීන්ට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත්, ඉදිරිපත් කිරීමේ සිට බලපත්‍ර නිකුත් කිරීම, දක්වා වැඩිදියුණු කිරීමට හැකි විය. එය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අත්පත් කරගත් සුවිශේෂී කාර්යසාධනයක් ලෙස සැලකිය හැකි අතර, සේවාලාභීන්ට ද කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට මෙමගින් සුවිශේෂි අවස්ථාවක් හිමි විය.

නිසි දැක්මක් මත නිසි මෙහෙවරකට අනුගත වෙමින්, ඩිජිටල් පරිවර්තනය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරමින් රාජ්‍ය යාන්ත්‍රණයට සක්‍රීය සහයෝගය ලබා දීම හා මහජනතාවට කාර්යක්ෂම, වේගවත් සහ ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලදී.

තවද, කාර්ය මණ්ඩලය ඩිජිටල් තාක්ෂණ භාවිතය, දත්ත කළමනාකරණය, සයිබර් ආරක්ෂාව සහ නවීන පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කරගැනීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 2025 වර්ෂයේ දී සංවිධානය කරන ලදී. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සුබසාධක සංගමයේ ද ඍජු දායකත්වය හා මෙහෙයවීම ලැබූ අතර, කාර්ය මණ්ඩලයට උද්යෝගීව හා කැපවීමෙන් යුතුව ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිසරය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට හැකි විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පියුආර්/බී/අයිඊසීඩී/2/25/එෆ්ඒ ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම් හා පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද එකතු වටිනාකම රු.647,701ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීමක් ලෙස හා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා දෙපාර්තමේන්තුවේ අග්‍රමය මගින් දරන ලද වියදමක් ලෙස දක්වා තිබුණි.

1.6.2 මූලධන වියදම්

විද්‍යුත් බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන **EXBS (Export Control and Border Security)** වැඩසටහන යටතේ ප්‍රදානයක් ලෙස ලබා දී තිබූ එකතු වටිනාකම රු.102,951,541ක මෘදුකාංග හා පරිගණකවල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ප්‍රදානයන් ලැබීම් ලෙසද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආයෝජන අත්පත්කර ගැනීමේ වියදමක් ලෙසද දක්වා තිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂය තුල ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතන 09කට ප්‍රදානයන් ලෙස ලබා දී තිබූ පිරිවැය රු.13,313,500ක් වූ පරිගණක 47ක වටිනාකම හා සමාලෝචිත වර්ෂය තුල ස්ථානමාරු වී ගිය සේවකයන් දෙදෙනෙකු විසින් දෙපාර්තමේන්තුවේ විධිමත් අවසරයක් මත රැගෙන ගොස් තිබූ පිරිවැය රු.484,000ක් වූ ලැප්ටොප් පරිගණක දෙකෙහි වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ සහ දේපළ, පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.13,797,500කින් වැඩියෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචන

3.1 ආදායම් කළමනාකරණය

ආදායම් සංකේත අංක 1001-03-00- බලපත්‍ර ආදායම් සඳහා මුලික ඇස්තමේන්තුව රු.3,800,000,000ක් වූ අතර පසුව එය රු.3,315,000,000ක් දක්වා සියයට 13කින් පමණ අඩුකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.4,154,003,841ක බලපත්‍ර ආදායමක් උපයා තිබීම හේතුවෙන් නිවැරදි පුරෝකථනයකට අනුකූලව ආදායම් ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 19ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 06 සිට සියයට 94ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද මුලික ඇස්තමේන්තුවෙන් සියයට 50ක් හා සියයට 40ක් මු.රෙ. 66/69 යටතේ වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුව ද ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා (1201) හා විදේශ ගමන් වියදම් (1102) සඳහා වෙන් කරන ලද පිළිවෙලින් රු.4,000,000ක හා රු.1,500,000ක ප්‍රතිපාදනයෙන් සියයට 31ක් සියයට 71ක් ඉතිරි වී තිබුණි. තවද, 2025 වසර සඳහා අයවැය කැඳවීම මගින් භාණ්ඩාගාර ලේකම්වරයා නිකුත් කර තිබූ අංක 02/2024 හා 2024 අගෝස්තු 12 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 3(II)(ආ) ඡේදය මගින් විදේශ පුහුණු වීම් සඳහා ප්‍රතිපාදන ඇතුලත් නොකරන ලෙස දැනුම්දී තිබියදීත් ඒ පිළිබඳව අවධානය යොමු නොකර විදේශ ගමන් වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කර තිබුණි.

(ඇ) වැය විෂය 1402 - තැපැල් හා සන්නිවේදන අවශ්‍යතා සඳහා වෙන් කරන ලද රු.13,040,000 ක ප්‍රතිපාදන වලින් මු.රෙ. 66/69 මාරු කිරීම් යටතේ රු.5,000,000 ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුවද සියයට 49 ක් ඉතිරි වී තිබුණු අතර ඒ සඳහා හේතු වශයෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට ගැසට් පත්‍ර මුද්‍රණය නොවීම දක්වා තිබුණි. කෙසේ වුවත්, 2025 වර්ෂයේදී නිකුත් කිරීමට සැලසුම්කර තිබූ ගැසට් පත්‍ර, ඒවායේ වැදගත්කම හා ඒවා නිකුත් නොකිරීමට හේතු වූ කරුණු විගණනයේදී අනාවරණය කර ගත නොහැකි විය.

3.2.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් **02** ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට **49** ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

3.3 අත්තිකාරම් ගිණුම්

සේවය හැර ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු වර්ෂ 1 සිට 3 දක්වා පැරණි රු.168,977ක ණය ශේෂය ද, වැඩ තහනම්කළ නිලධාරීන්ගෙන් අය විය යුතු වර්ෂ 5ට වඩා පැරණි රු.335,753ක ණය ශේෂය ද හා වර්ෂ 1සිට 3දක්වා පැරණි රු.238,000ක ණය ශේෂය ද ලෙස එකතු වටිනාකම රු.742,730ක හිඟ ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කඩිනමින් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
(i)	මු.රෙ 371 සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020	තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථාවන් 05ක දී ලබා ගෙන තිබූ රු.11,400 සිට රු.25,400 දක්වා පරාසයක වූ අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 11 සිට දින 27ක කාලපරාසයක් ගතවී තිබුණි.
(ii)	මු.රෙ 880	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් 03 දෙනෙකු විසින් 2025 දෙසැම්බර් 31 වන විටත් නියමිත පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.
(iii)	මු .රෙ.1645(අ)	සෑම වාහනයක් සඳහාම පොදු ආකෘති 267 ප්‍රකාරව ලොග් පොතක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.
(ආ)	රජයේ වාහන නඩත්තු කිරීම මැයෙන් නිකුත් ඇති අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳව සෑම ඉන්ධන පරීක්ෂාවට පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණය ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවන්ට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු බව දක්වා තිබුණද, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සතු වාහන 4ක් සම්බධයෙන් කිසිදු අවස්ථාවක ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක් ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සලකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනයක් (Quantity Control) නොකරන බව නිරීක්ෂණය විය.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම සහ එකී රෙගුලාසි වලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම ද, දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්යභාරයන් වශයෙන්, 2025 වර්ෂය සඳහා කෙටුම්පත් කල කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව ආනයන පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට විගණනයට නිරීක්ෂණය නොවුණි.

4.2 කළමනාකරණ දුර්වලතා

(අ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා විදේශ සැපයුම්කරුවන්ට මුදල් ප්‍රේෂණය කිරීමේදී භාවිත කල හැකි ගෙවීම් ක්‍රම, ඊට අදාල නියමයන් හා කොන්දේසිවලට අදාල විධි විධාන ප්‍රකාශයට පත් කරමින් 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් නිකුත් කර තිබු අංක 1739/3 හා 2012 ජනවාරි 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව පෙර ගෙවීම් (Cash in Advance) ක්‍රමය භාවිත කර මුදල් ප්‍රේෂණය කර දින 180 ක් ඉක්මවීමට පෙර අදාළ භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කල යුතු වුවද, නියැදි විගණන පරීක්ෂාවේදී 2023 ජනවාරි මස අවස්ථා 82කදී ආනයනකරුවන් 59 ක් එ.ජ.ඩො.40,000-50,000 අතර වටිනාකමින් යුත් එකතු වටිනාකම එ.ජ.ඩො.3,679,985ක් එනම් රු.මිලියන 1,333.70කට (එ.ජ.ඩො 01= රු 362.42) ආසන්න මුදලක් ද, තවත් ආනයනකරුවන් 10 දෙනෙකු විසින් 2023 ජුනි සිට 2025 පෙබරවාරි දක්වා

කාලය තුල අවස්ථා 191 දී එකතු වටිනාකම එ.ජ.ඩො.8,958,890ක එනම් රු. මිලියන 2,718 කට ආසන්න මුදලක් විවිධ රටවල්වලින් භාණ්ඩ ආනයනය කිරිමට යෝජිත බව සඳහන් නාමමාත්‍ර ඉන්වොයිසි අමුණා විවිධ රටවල අපනයනකරුවන් වෙත ප්‍රේෂණය කර තිබු නමුත් එකී ප්‍රේෂණයන්ට අදාල කිසිදු භාණ්ඩයක් 2025 ජුලි 07 දින වන විටත් ආනයනයකර නොතිබුණු බව රේගු පරිගණක පද්ධතිය පරීක්ෂා කිරිමේ දී නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ,

(i) ගැසට් නිවේදනයේ 6(1)(ආ) ඡේදය අනුව විදේශ ප්‍රේෂණවල වටිනාකම එ.ජ.ඩො. 50,000 ඉක්මවන අවස්ථාවලදි එකී වටිනාකමට සරිලන බැංකු ඇපකරයක්/සම්පස්ථ ණයවර ලිපියක් ඉදිරිපත් කිරිමට හෝ අදාල නියමයන් සම්පූර්ණ කිරීම මගින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වේ. එහෙත්, ආනයනකරුවන් අට දෙනෙකු විසින් තම ප්‍රේෂණවල වටිනාකම එ.ජ.ඩො. 50,000ක අගය ඉක්මවීම වලක්වා ගැනීම පිණිස එකම දිනයක දී එකම අපනයනකරුවෙකු වෙත එ.ජ.ඩො. 50,000කට අඩු ප්‍රේෂණ අවස්ථා කිහිපයක් භාවිතා කරමින් එ.ජ.ඩො.82,066 සිට එ.ජ.ඩො.172,800 දක්වා මුදලක් ප්‍රේෂණය කර තිබූ නමුත් උක්ත ගැසට් නිවේදනයට අනනුකූල ලෙස එවැනි මුදල් ප්‍රේෂණයන් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි. තවද, ගැසට් නිවේදනයේ 18 වගන්තිය යටතේ විනිමය පාලක සහ ආනයන හා අපනයන පාලක විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වාණිජ බැංකුවලින් විමසා, ගැසට් පත්‍රයේ 3 සිට 17 දක්වා වන නියෝග ප්‍රකාරව කරනු ලබන ගෙවීම් අධීක්ෂණය කිරිම සඳහා වූ කාර්යපටිපාටීන් අනුගමනය කර, ගෙවීම් කිරීම අනුව නියමිත කාලය තුල භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථා සම්බන්ධයෙන් නීතියේ නියමකර ඇති පියවර ගනු ලැබිය යුතු බව දක්වා තිබුණි.

(ii) ගැසට් නිවේදනයේ 6(1)(ආ) ඡේදය අනුව විදේශ ප්‍රේෂණවල වටිනාකම එ.ජ.ඩො. 50,000 ඉක්මවන අවස්ථා පමණක් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ නියාමනයට යටත් කර ඇති අතර එ.ජ.ඩො. 50,000 ට අඩු ප්‍රේෂණයන් සිදු කිරීමේදි අයදුම්පත්‍රය හා ප්‍රේෂණයේ වටිනාකමට සමාන නාමමාත්‍ර ඉන්වොයිසියක් බැංකු වෙත ඉදිරිපත්කර ප්‍රේෂණයන් සිදු කළ හැකි බව නිරීක්ෂණය විය.එහෙත්, එලෙස සිදු කරන ප්‍රේෂණයන් සඳහා භාණ්ඩ ආනයනය කෙරෙන බව හා උක්ත ප්‍රතිපාදනය අවභාවිතා කර නීති විරෝධි ප්‍රේෂණයන් සිදු නොවන බව තහවුරු කිරිමට ගැසට් නිවේදනයේ ඇතුලත් පාලන ක්‍රමවේදයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ඇගයීමක් සිදුකර නොතිබුණි.

(iii) ගැසට් නිවේදනයේ 6(1)(ආ)(ii) ඡේදය ප්‍රකාරව ආනයන හා අපනයන පාලකවරයාගේ අනුමැතිය මත සිදුකල එ.ජ.ඩො. 50,000 ට වැඩි ප්‍රේෂණයන්, විදේශ ප්‍රේෂණයන් සිදු කරන ආනයනකරුවන්ගේ යෝග්‍යතාවය පරික්ෂා කර වාණිජ බැංකු වෙත නිකුත් කර තිබූ යෝග්‍යතා සහතික ලිපි හා අදාල ප්‍රේෂණය සිදු කර ඊට අදාල තොරතුරු ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කල ලිපි සම්බන්ධ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුල ආනයන හා අපනයන පාලකවරයාගේ අනුමැතිය මත සිදුකල ප්‍රේෂණයන් සංඛ්‍යාව හා ඊට අදාල ආනයනයන් සිදුවී ඇත්ද යන්න සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි.

(iv) ගැසට් නිවේදනය නිකුත් කර වසර 14කට අධික කාලයක් ගත වී තිබුණද සත්‍ය ආනයනයන් සඳහා පමණක් ප්‍රේෂණයන් සිදුවන බව තහවුරුකිරීම පිණිස ගැසට් නිවේදනයේ ඇතුලත්කර ඇති නියාමනයන් හා පූර්ව කොන්දේසි නිවැරදිව ක්‍රියාත්මකවන බව තහවුරු කිරීමට නිරන්තර අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමට මෙම ගැසට් නිවේදනය බලාත්මක කිරීමට අධිකාරි බලය ලත් ආයතන ව්‍යුහයක් වන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වන අතර ඒ හේතුවෙන් ඌන තක්සේරුකර සිදුකර ඇති වෙනත් ආනයනයන්ට අදාල හිඟ මුදල් ප්‍රේෂණය කිරීම හා නීත්‍යානුකූල නොවන අයුරින් උපයා ගත් මුදල් විදේශ රටවල් වෙත ප්‍රේෂණය කිරීම වැනි දෑ සඳහා මෙම ප්‍රේෂණ ක්‍රමය භාවිතා කිරීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඖෂධ සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත්කිරීම හා හර කිරීම මැයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් නිකුත්කර ඇති අංක 02/2021 හා 2021 මාර්තු 10 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 6(b) වගන්තියේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව ආනයනික ඖෂධවල විශ්ලේෂණ වාර්තාවල මුල් පිටපත හෝ මුල් පිටපත සහතික කරන අය විසින්ම සහතික කල පිටපතක් ඉදිරිපත් කිරීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ දී ආයතන 07ක් විසින් අවස්ථා 16 කදී ආනයනය කල ඖෂධ වර්ග 16ක් නිදහස් කිරීමට ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. 2026 ජනවාරි 27 දින වන විටත් එම ඖෂධ නිදහස් කර දින 42 සිට දින 305ක කාලයක් ගත වී තිබුණද ආනයනකරුවන් එකඟ වූ පරිදි ඖෂධ විශ්ලේෂණ වාර්තාවල මුල් පිටපත් හෝ සහතික කල පිටපත් ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර එකී ආනයනකරුවන් සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රාජ්‍ය ආයතනවල තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මැයෙන් තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිකුත් කර තිබූ අංක MOT/2023/01 හා 2023 මැයි 02 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම රජයේ ආයතන, තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කල යුතු බව දක්වා තිබුණද, ආනයන හා අපනයන

පාලන දෙපාර්තමේන්තුව එකී චක්‍රලේඛය ප්‍රකාරව තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.තවද, ශ්‍රී ලංකා සර්ට් ආයතනය විසින් හඳුන්වා දී ඇති තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණ කමිටුවක් පත් කිරීම, ආපදා ප්‍රතිසාධන සැලැස්මක් සකස් කිරීම, දත්ත පද්ධතිවල ආරක්ෂාව සඳහා මුරපද ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම යනාදී කාර්යයන් කිසිවක් ඉටුකොට නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය සහ පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	14	12	2
තෘතියික මට්ටම	4	3	1
ද්විතික මට්ටම	84	74	10
ප්‍රාථමික මට්ටම	20	15	5
එකතුව	**122**	**104**	**18**

2025 ජනවාරි 01 දින සිට මාර්ගගත ක්‍රමවේදය යටතේ ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා පරිගණක වැඩසටහනක් හඳුන්වා දී ක්‍රියාත්මක කර තිබුණද, ඒ අනුව සත්‍ය සේවක අවශ්‍යතාවය පිළිබඳ නැවත සමාලෝචනයක් සිදුකර කාර්යය මණ්ඩල සංශෝධනයක් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.